# ස්ථාවර ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

**ආපදා ස්ථානීය අංක. 152**
**කිංග්ස්වුඩ් විද්‍යාලය**
**මහනුවර දිස්ත්‍රික්කය**

**සැප්තැම්බර් 2023**


ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
ASIAN INFRASTRUCTURE INVESTMENT BANK
වෙනුවෙන්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු.ක. 011-2588946, 011-2503431, 0112-2500354
සකසන ලදී

පටුන

1.හැඳින්වීම .......... 1
1.1 ව්‍යාපෘති පසුබිම .......... 1
1.2 අපේක්ෂිත පරිශීලකයින් .......... 1
2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය .......... 2
2.1 ව්‍යාපෘතියේ නම .......... 2
2.2 ව්‍යාපෘති ස්ථානයේ පිහිටීම .......... 2
2.3 භූ ලක්ෂණ සහ ඉඩම් අයිතිය .......... 2
2.4 ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ .......... 3
2.5 පාසලේ ජනවිකාශන ලක්ෂණ .......... 3
3. සිදුවූ නායයෑම් උපද්‍රවය පිළිබඳ තොරතුරු .......... 3
3.1 නායයෑම් ආපදාවේ ස්වභාවය .......... 3
3.2 නායයෑමෙන් සිදුව ඇති බලපෑම හා ප්‍රතිවිපාක .......... 4
3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග .......... 4
3.4 ඉවත් කිරීම් .......... 4
3.5 නැවත පදිංචි කිරීම (ප්‍රගතිය) .......... 4
4. නායයෑම්/ භූමි අස්ථාවර වූ ප්‍රදේශය, ඒ අවට ප්‍රදේශය පිළිබඳ විස්තර සහ වර්තමාන අවදානම් මට්ටම .6
4.1 නායයෑමේ ප්‍රදේශය .......... 6
(වැඩිදුර අධ්‍යනය සඳහා රූපය 3: ගූගල් ඡායාරූපය, භූමි හරස්කඩ, භූමි පරිහරණය, අවදානම් අංගයන් සහ ස්ථානයෙහි විශේෂ ලක්ෂණ සහිත සථානයන් වල ඡායාරූප) .......... 6
4.2 අස්ථාවර වී ඇති බෑවුමට යාබද ප්‍රදේශය .......... 6
4.3 වර්තමාන අවදානම් ස්වභාවය .......... 6
5. ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන් .......... 7
7. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම .......... 9
7.1 හිතකර බලපෑම් .......... 9
7.2 අහිතකර බලපෑම් .......... 9
7.2.1 ජල විද්‍යාත්මක බලපෑම් .......... 9
7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාව කෙරෙහි බලපෑම .......... 9
7.2.1.2 ජල දූෂණය සම්බන්ධයෙන් ඇති බලපෑම .......... 9
7.2.1.3 පාංශු ඛාදනයේ බලපෑම සහ ගංගා පතුළ වෙනස්වීම .......... 9
7.2.1.4 අක්‍රමවත් වැසිකිලි භාවිතය නිසා ජලයෙන් පැතිරියහැකි ආසාධන .......... 9
7.2.1.5 පහළ ප්‍රදේශයේ ජල පරිභොජකයන්ට ඇති විය හැකි බලපෑම් .......... 9
7.2.1.6 භූගත ජල මට්ටමට හා භූගත ජලයේ ගුණාත්මකභාවයට විය හැකි .......... 10
7.2.1.7 ජලය හෝ තෙත්බිම් වලට වන බලපෑම් .......... 10
7.2.2 පාරිසරික බලපෑම් .......... 10
7.2.2.1 ශබ්දය හා කම්පන මගින් ඇති විය හැකි බලපෑම් .......... 10

7.2.2.2 වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම ........ 10
7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු ........ 10
7.2.2.4 පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය භාවිතය ........ 10
7.2.3 ජීව විද්‍යාත්මක /පරිසර විද්‍යාත්මක බලපෑම ........ 10
7.2.3.1 සැලකිය යුතු වනජීවී වාසස්ථානවල බලපෑම් ........ 11
7.2.3.2 සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි බලපෑම් ........ 11
7.2.4 සාමාජීය හා ආර්ථික බලපෑම් ........ 11
7.2.4.1 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම් ........ 11
7.2.4.2 කම්පන නිසා ගොඩනැගිලි වලට විය හැකි බලපෑම ........ 11
7.2.4.3 භූමියට සහ අනාගත සංවර්ධන කටයුතුවලට ප්‍රවේශය අහිමි වීම ........ 11
7.2.4.4 ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ........ 11
7.2.4.5 සේවා සැපයීම කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් (ජල සැපයුම, අපද්‍රව්‍ය විදුලිය) ........ 11
7.2.4.6 යටිතල පහසුකම් අහිමි වීම සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන බලපෑම ........ 11
7.2.4.7 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන් ........ 11
එවැනි ගැටලුවලට සම්බන්ධ වන කම්කරුවන් දුර්ලභ වුවද සමහර අවස්ථාවන් නොසලකා හැරිය නොහැකිය. එමනිසා, මෙම ව්‍යෘපෘති ස්ථානයේ සමාජ සහ ප්‍රජා ගැටළු අතිශයින් වැදගත් වනු ඇත ........ 12
7.2.4.9 ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව ........ 12
7.2.4.10 ඉදිකිරීම් අතරතුර පාසල් ළමුන් ව්‍යාපෘති භූමියට පිවිසීමේ අවදානම ........ 12
7.2.4.11 ප්‍රවාහන යටිතල පහසුකම් කෙරෙහි ඇතිවන බලපෑම් (විශේෂයෙන් මාර්ග හෝ දුම්රිය ප්‍රවේශය තාවකාලිකව අහිමි වීම, මාර්ග තදබදය මගින් ඇතිවන අවදානම) ........ 12
7.2.4.12 පිළියම් යෙදිය යුතු ප්‍රදේශය තුල පවතින ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු . 12
7.2.4.13 පිළියම් යෙදිය යුතු ප්‍රදේශය ආසන්නයේ පවතින ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු ........ 12
7.2.4.14 වැඩ බිම තුළට ශිෂ්‍යාන්, පාසල් කාර්ය මණ්ඩලය සහ ප්‍රදේශවාසීන් ඇතුළු වීම නිසා ඇතිවන අවදානම ........ 13
8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම්: NBRO සහ කොන්ත්‍රාත්කරුගේ පාර්ශව වලින් විශේෂ ක්‍රියාමාර්ග අවශ්‍ය වන සමාජ හෝ පාරිසරික බලපෑම් හෝ අවදානම් සහිත අවස්ථා ........ 13
8.1 සැලකිය යුතු පාරිසරික හා සමාජ බලපෑම් ........ 13
8.2 සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඩ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය: කොන්තාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ කරුණු ........ 13
8.3 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම ........ 13
9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ........ 13
9.2 පදිංචි ජනතාව ඉවත් කිරීම ........ 14
9.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය) ........ 14
9.4 ව්‍යාපෘතිය ක්‍රියාමාර්ග හේතුවෙන් දේපල/භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ගෙවීම ........ 14
9.5 පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම ........ 14

9.6 සැළසුම් මත පදනම් වූ පාරිසරික සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම.................... 14
9.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම.............................................................. 16
9.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන්........................................................................................................ 16
9.7.2 නාය ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම ........................................................... 17
9.7.3 ව්‍යාපෘති ස්ථානයට අදාල විශේෂිත අධීක්ෂණ තත්ත්වයන් ........................................ 22
10.සේවක කළමනාකරණය ........................................................................................23
11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් -19 වැළැක්වීමේ පියවර .........23
12.පදිංචි ජනතාව සහ පාර්ශවකරුවන්ගේ උපදේශන - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන් .........................................................................................23
12.1 මහජන උපදේශන ................................................................................................. 23
12.2 පාර්ශවකරුවන් සමග පවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකගතාවයන් හා නිර්දේශයන් (යොමුව: ඇමුණුම II)............................................................................................ 23
13.ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යෝග්‍යතා, කැමැත්ත ප්‍රකාශනය, එකඟතාව සහ අනුමත කිරීම24
13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ................................................................................ 24
13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය ................................................ 24
13.3 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබාගැනීම/නෛතික බැඳීම්/ විරුද්ධත්වයක් නොමැති වීම.......................................................................................................... 24
14. දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රනය..................................................................25
15.තොරතුරු අනාවරණය කිරීම..................................................................................25

**ඇමුණුම් ලැයිස්තුව**

ඇමුණුම I: ව්‍යාපෘති ප්‍රදේශය සහ අදහස් විමසීම් සිදුකරණ අතරතුර ලබාගත් ඡායාරූප..........................i
ඇමුණුම II: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පරිසර ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රියා පටිපාටිය.............................................................................................................i
ඇමුණුම III: අධ්‍යන කණ්ඩායම .........................................................................................ii
ඇමුණුම IV: යොමු ලැයිස්තුව.............................................................................................ii

## රූපසටහන් ලැයිස්තුව


*රූපය* 1: යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානයට පිවිසුම් මාර්ගයි .......... 2
රූපය 2: යෝජිත නායයෑම් අවම කිරීමේ ස්ථානයේ ගූගල් රූපය, අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම්. .......... 3
රූපය 3: ස්ථානයේ ඉඩම් පරිහරණය හා අවදානම් අංග සහිත හරස්කඩ .......... 5
රූපය 6a: 12 ශ්‍රේණියේ ටෙක් 2 ගොඩනැගිල්ල ඉදිරිපිට බෑවුම (සනීපාරක්ෂක පහසුකම් පිටුපස) (L1) .... 7
රූපය64b: වාණිජ ගොඩනැගිල්ල ඉදිරිපිට (සනීපාරක්ෂක පහසුකම් සහිත ස්ථානයට දකුණු පසින් ) (L2) 7
රූපය 6c: කලා ගොඩනැගිල්ල පිටුපස බෑවුම් කොටස (L3) .......... 7
රූපය 6d: 12 ශ්‍රේණියේ තාක්ෂණික ගොඩනැගිල්ල සහ බුද්ධ ප්‍රතිමාව අතර බෑවුම (L4).......... 7
.......... 8
රූපය 6e: ගුරු සනීපාරක්ෂක පහසුකම් සහ ගෘහ විද්‍යාගාරය පිටුපස බිඳවැටුණු මාර්ගය සහ බෑවුම් කොටස (L5) .......... 8
රූපය 6f: සී කොටසේ අංක 2 දරණ බාලක ස්නාන ස්ථානය ආසන්න පඩි පෙළ (L6) .......... 8
රූපය 6g: නේවාසිකාගාරය සහ පැරණි ආපන ශාලාව අතර ඉඩම් කොටස (L7) .......... 8
රූපය 6h: මුළුතැන්ගෙය සහ ක්‍රීඩා මණ්ඩපය අතර බෑවුම් කොටස(L8).......... 8
රූපය 6I: නැටුම් කාමරය සහ අලුතින් ඉදිකරන ලද මහල් 4 ක ගොඩනැගිල්ල අතර අස්ථායී බිම් කොටස (L9.) .......... 8
රූපය 6J: ක්‍රීඩා මණ්ඩපය ආසන්නයේ බෑවුම (L10).......... 8


## වගු ලැයිස්තුව


වගුව 1: සෘණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම .......... 9
වගුව 2: සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම .......... 14
වගුව 3: පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන් ES & HS .......... 16
වගුව 5: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර.......... 22
වගුව 7: බාධා ඉවත් කර ගැනීම්, විරෝධතා නොමැති බව, කැමැත්ත සහ අනුමත කිරීම් .......... 24
වගුව 8: අනුමැතීන් ලබාගැනීම සඳහා නියමිත කාල රාමුව .......... 25
වගුව 9: තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම.......... 26
වගුව 10: තොරතුරු රැස්කිරීම සඳහා සම්බන්ධකරගත් ආයතන සහ නිලධාරීන්.......... 26
ඇමුණුම III: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රියා පටිපාටිය. .......... ii

## කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශිය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසරික හා සමාජ ආරක්ෂණය<br>Environmental Health & Social |
| E&SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ අංශයේ පාරිසරික සමාජ ඒකකය<br>Environmental & Social Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| SSE & SMP | ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමානාකරණ සැළසුම<br>Site Specific Environmental and Social Management Plan |
| ESMP | පාරිසරික හා සමාජ කළමනාකරණ සැළසුම<br>Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරී<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>Geological Surveys & Mines Bureau |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>National Building Research Organization |
| RHS | දකුණු පස<br>Right Hand Side |
| LHS | වම් පස<br>Left Hand Side |

1.හැඳින්වීම

**1.1** ව්‍යාපෘති පසුබිම

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (**AIIB)** හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මූල්‍ය ආධාර මත ශ්‍රී ලංකාවේ පළාත් **6**ක දිස්ත්‍රික්ක **11**ක නාය යෑම් සිදුවන ස්ථාන පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය ක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් **AIIB** බැංකුවේ හා ලංකා රජයේ නීතිරීතිවලට අනුකූලව සිදුවිය යුතුය. ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් **AIIB** බැකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවක් (**ESMF)** සකසා ඇත.

පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවහි (**ESMF**) අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී **AIIB** බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබද මාර්ගොපදේශයන් සැපයීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්**;** ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා.ගො.ප.ස.) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරණු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව**,** ව්‍යාපෘතිය ට අදාල පාර්ශවයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික**,** සමාජ**,** සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්වයන් පිළිබද අවධානය යොමු කිරීම වැදගත් වේ. එමනිසා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජයීය ඇගයීම් සදහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා (**SSE & SMP)** සකසා ඇත. එම ස්ථානයේ විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිළිබද සැළසුම් මගින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන්**,** සෞඛ්‍ය**,** සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්දයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබද ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබාදෙනු ඇත.

මෙම විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම කිංග්ස්වුඩ් විද්‍යාලයේ නායයෑම් අවම කිරීමේ ස්ථානය සඳහා සකස් කර ඇත. **ගැඹුරු පාරිසරික හා සමාජ අධ්‍යයනයකින් පසුව සකස් කර ඇති මෙම සැළසුම මගින් පහත කරුණු පිළිබදව ඉහළ අවධානයක් යොමු කර ඇත**

I. ව්‍යාපෘතිය ට අදාල කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම.
II. ව්‍යාපෘතිය හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම.
III. හානිය අවම කරන පියවර යෝජනා කිරීම.
IV. මෙම ව්‍යාපෘතිය ට අදාල වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම.
**V.** ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර අදාළ පාරිසරික නියාමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම.

**1.2 අපේක්ෂිත පරිශීලකයින්**

යෝජිත ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිසරික හා සමාජීයගැටළු, සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ගැඹුරු අවබෝධයක් වාර්තාවෙන් සපයන අතර නායයෑම් අවම කිරීමේ සැලසුම් කණ්ඩායම, ව්‍යාපෘති කළනාකරණ ඒකකය (PMU) සහ කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවෙහි අඩංගු සංරචක, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කිරීමට අදහස් කරයි. නිශ්චිත පාරිසරික කළමනාකරණ සැලසුම ජා.ගො.ප.සං වෙබ් අඩවියේ හා AIIB වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරණු ලබන අතර මේ සම්බන්ධයෙන් පුළුල් පරාසයක උනන්දුවක් දක්වන පාර්ශවයන්ට (පොදු ජනතාව, වෙනත් ආයතන/සංවිධාන) පරිශීලනය කල හැක. කොන්ත්‍රාත්කරුවන්ටද වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති මෙම ස්ථානීය පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESPM) පරිශීලනය කර, ඔවුන්ගේ ස්ථානීය පාරිසරික හා සාමාජීය කළමනාකරණ ක්‍රියාකාරී සැළැස්ම (SSE-SMAP) සකස් කිරීමේ පදනම ලෙස යොදාගත හැක.

2. **නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය**

**2.1 ව්‍යාපෘතියේ නම**

ආපදා ස්ථානීය අංක. 118, **මහනුවර දිස්ත්‍රික්කය**, කිංග්ස්වුඩ් විද්‍යාලය.


**2.2 ව්‍යාපෘති ස්ථානයේ පිහිටීම**

යෝජිත නායයෑම් අවදානම අවම කිරීමේ ස්ථානය මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ පරිපාලන කටයුතු සිදුවන ගඟ වට කෝරලය ග්‍රාමනිලධාරී වසම තුළ සිදුව ඇත.

ස්ථානීයයේ GPS ඛණ්ඩාංක – 7.277600 °N සහ 80.015879°E

**ආසන්නතම නගරය - නුවර**


**ප්‍රවේශ වීමේ හැකියාව** - මහනුවර නගරය ආපදා ස්ථානයේ සිට කිලෝමීටර 2.7 ක් පමණ දුරින් පිහිටා ඇත. A1 නුවර - කොළඹ මාර්ගය හරහා ආපදා ස්ථානයට ප්‍රවේශ විය හැක. (යොමුව.රූපය . 1)




*රූපය 1:* යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානයට පිවිසුම් මාර්ගයි

**2.3 භූ ලක්ෂණ සහ ඉඩම් අයිතිය**

යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානය පිහිටා ඇත්තේ මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලය පරිශ්‍රය තුළ ය. ප්‍රදේශයේ උන්නතාංශය MSL 500කට ආසන්නය. නාය යාම් ආපදා අවම කිරීමට යෝජිත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 4.78ක් පමණ වේ. පාසල් ගොඩනැඟිලි කපන ලද ස්වභාවික අස්ථායි බෑවුම් ප්‍රදේශය තුල ඉදිකර ඇත. පාසල් ඉඩමේ අයිතිය අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතුයි. *(වැඩිදුර අධ්‍යනය සඳහා රූපය 2. යොජිත නායයෑම් අවම කිරීමේ ප්‍රදේශය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ අනෙකුත් ලක්ෂණ හා සේවා පහසුම්).*




රූපය *2:*  යෝජිත නායයෑම් අවම කිරීමේ ස්ථානයේ ගූගල් රූපය, අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම්.

### 2.4 ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ

වාර්ෂික දල වර්ෂාපතනය – 1773 මි.මී

වාර්ෂික දල උෂ්ණත්වය – 23.5 °C

(මූලාශ්‍රය: ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය -මහනුවර)

### 2.5 පාසලේ ජනවිකාශන ලක්ෂණ

මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලය 1891 දී "Louis Edmund Blaze" විසින් පුද්ගලික පාසලක් ලෙස ආරම්භ කරන ලදී. 1961 න් පසු එය රජයේ පාසලක් බවට පත් විය. කිංග්ස්වුඩ් විද්‍යාලය රගර් සහ බේස්බෝල් වැනි ක්‍රීඩා සඳහා ශ්‍රී ලංකාවේ පාසල් අතර ප්‍රසිද්ධියක් උසුලන අතර තවද විවාද සහ නැටුම් කණ්ඩායම් අතරද ඉහළම මට්ටමක පවතී. මෙම පාසලේ සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 14 කි.

පාසලේ ජනගහනය 3402 ක් වන අතර එයට 1 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සිසුන් 3200 ක්, ගුරුවරුන් 160 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 42 ක් ඇතුළත් වේ.

## 3. සිදුවූ නායයෑම් උපද්‍රවය පිළිබඳ තොරතුරු

### 3.1 නායයෑම් ආපදාවේ ස්වභාවය

මීට වසර 5කට පමණ පෙර අධික වර්ෂා කාලවලදී කිංග්ස්වුඩ් විද්‍යාලයේ පාසල් ගොඩනැගිලි ආශ්‍රිත ඇතැම් බෑවුම් සහිත ප්‍රදේශ කඩා වැටීමට ලක් වී ඇති අතර  දැනට පාසැලේ බෑවුම් බිඳවැටීම් සඳහා ඉහළ අවදානම් සහිත ස්ථාන ලෙස අස්ථායී බෑවුම් කොටස් දහයක් හඳුනා ගෙන ඇත. මෙම සමස්ත පාසල් පරිශ්‍රයම කඩා  වැටීම් සහ භූ ස්ථාවර වීම් සිදුවීම සඳහා ඉහළ සම්භාවිතාවක් පවතින අතර  වැසි සමයේදී භූ ස්ථාවර වීම් සිදුවීමේ ඉහළ  අවදානමක් පැවතීම හේතුවෙන් සිසුන්ට, ගුරුවරුන්ට සහ අනෙකුත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට එමගින් දැඩි  අවදානමක් ඇති විය හැකිය . (*රූපය 3 බලන්න: භූමියේ හරස්කඩ, ඉඩම් පරිහරණය, ස්ථානයේ අවදානම් අංග.)*

**3.2 නායයෑමෙන් සිදුව ඇති බලපෑම හා ප්‍රතිවිපාක**

මින් පෙර සිදු වූ නාය යෑම් හේතුවෙන් පුද්ගලයෙකුට කිසිදු හානියක් හෝ ගොඩනැගිලිවලට භෞතික හානි සිදුවී නොමැති අතර ගුරු වැසිකිලි සහ ගෘහ විද්‍යාගාරය පිටුපස මාර්ගය අබලන් වී ඇති බව නිරීක්ෂණය වේ.

**3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග**


අවදානම් අවම ක්‍රියාමාර්ග ලෙස ප්‍රදේශයේ ඇති විය හැකි නාය යාම් අවදානම අවම කිරීම සඳහා රැඳවුම් බිත්ති ඉදිකිරීම, පාංශු ඇණ ගැසීම, ජලාපවහන වැඩිදියුණු කිරීම සහ සමහර අවදානම් ස්ථානවල නෙත්ති කාණු ඉදිකිරීම සිදු කරන ලදී.

**3.4 ඉවත් කිරීම්**

මෙම ස්ථානවල කිසිදු ඉවත් කිරීමක් සිදු කර නොමැත.

**3.5 නැවත පදිංචි කිරීම (ප්‍රගතිය)**

මෙම ස්ථානය සඳහා ව්‍යාපෘතිය පදනම් කරගත් නැවත පදිංචි කිරීමේ වැඩසටහනක් අවශ්‍ය නොවේ.




රූපය *3:* ස්ථානයේ ඉඩම් පරිහරණය හා අවදානම් අංග සහිත හරස්කඩ

### 4. නායයෑම්/ භූමි අස්ථාවර වූ ප්‍රදේශය, ඒ අවට ප්‍රදේශය පිළිබඳ විස්තර සහ වර්තමාන අවදානම් මට්ටම

#### 4.1 නායයෑමේ ප්‍රදේශය

මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාල පරිශ්‍රයේ පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය වූ භූමිය ලබා ගැනීමට කපා දමන ලද බෑවුම්(කණ්ඩි ) කඩාවැටීම් නිරීක්ෂණය විය.

**1891** මැයි **4** වන දින ලුවී එඩ්මන්ඩ් බ්ලේස් විසින් මහනුවර පැවිලියන් වීදියේ පිහිටි ස්ථානයක සිසුන් එකොළොස් දෙනෙකු සමඟ ආරම්භ කරන ලද කිංග්ස්වුඩ් විද්‍යාලය පිරිමි ළමුන් සඳහා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලබා දෙන ශ්‍රී ලංකාවේ පොදු පාසලකි. පසු කාලයේදී මෙම පාසල රන්ඩල්ස් හිල් වෙත ගෙන යන ලදී. එතැන් සිට**,** පාසල සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර**,** සිසුන් **3,500** කට අධික සංඛ්‍යාවක් සහ **300+** පමණ වූ පීඨ සාමාජිකයින් එහි සිටී. එය මහනුවර පැරණිතම පාසලක් වන අතර පොදුවේ **KCK** ලෙස හැඳින්වේ.

පාසල් පරිශ්‍රය තුළ ඇති විය හැකි බෑවුම් බිඳවැටීම් ලෙස ස්ථාන දහයක් හඳුනාගත හැකිය.

1. ස්ථානය 1: 12 ශ්‍රේණියේ ටෙක් 2 ගොඩනැගිල්ල ඉදිරිපිට බෑවුම (සනීපාරක්ෂක පහසුකම් සහිත ස්ථානය පිටුපස) (7.277259, 80.
2. ස්ථානය 2: වාණිජ ගොඩනැගිල්ල ඉදිරිපිට (සනීපාරක්ෂක පහසුකම් සහිත ප්‍රදේශයට දකුණු පසින් ) (7.277180, 80.614819)
3. ස්ථානය 3: කලා ගොඩනැගිල්ල පිටුපස බෑවුම් කොටස (7.277490, 80.614836)
4. ස්ථානය 4: 12 ශ්‍රේණියේ තාක්ෂණික ගොඩනැගිල්ල සහ බුද්ධ ප්‍රතිමාව අතර බෑවුම. (7.277376, 80.614727)
5. ස්ථානය 5: ගුරු සනීපාරක්ෂක පහසුකම් සහ ගෘහ විද්‍යාගාරය පිටුපස බිඳවැටුණු මාර්ගය සහ බෑවුම් කොටස (7.277914, 80.615343)
6. ස්ථානය 6: සී කොටසේ අංක 2 දරණ බාලක නාන ස්ථානය ආසන්න පඩි පෙළ (7.277738, 80.614987)
7. ස්ථානය 7: නේවාසිකාගාරය සහ පැරණි ආපන ශාලාව අතර ඉඩම් කොටස (7.278142, 80.615242)
8. ස්ථානය 8: මුළුතැන්ගෙය සහ මණ්ඩපය අතර බෑවුම් කොටස (7.278650, 80.615492)
9. ස්ථානය 9: නැටුම් කාමරය සහ අලුතින් ඉදිකරන ලද මහල් 4 ක ගොඩනැගිල්ල අතර අස්ථායී බිම් කොටස (7.278429, 80.615562)
10. ස්ථානය 10: මණ්ඩපය ආසන්නයේ බෑවුම (7.279162, 80.615281)

(වැඩිදුර අධ්‍යනය සඳහා රූපය **3:** ගූගල් ඡායාරූපය**,** භූමි හරස්කඩ**,** භූමි පරිහරණය**,** අවදානම් අංගයන් සහ ස්ථානයෙහි විශේෂ ලක්ෂණ සහිත සථානයන් වල ඡායාරූප)

#### 4.2 අස්ථාවර වී ඇති බෑවුමට යාබද ප්‍රදේශය

අවදානම් සහිත බෑවුම ප්‍රදේශය පාසලේ ගොඩනැගිලි සහ කොටස් වලින් සමන්විත වන අතර පාසල් පරිශ්‍රයේ ඉහළ බෑවුම් ප්‍රදේශය "රන්ඩල්ස් බාලදක්ෂ උද්‍යානය" නමින් හැඳින්වෙන ඝන වනාන්තර ප්‍රදේශයකින් සමන්විත වේ. එය කඳු නැගීමේ කටයුතු සඳහා භාවිතා වේ.

මෙම බෑවුම් සහිත ප්‍රදේශය සාප්පු සහ හෝටල් වලින් සමන්විත වාණිජ ප්‍රදේශයක් වන අතර මේ වන විට නාගරීකරණය ලක් වී ඇත. තවද A1 නුවර - කොළඹ ප්‍රධාන මාර්ගය පාසල ඉදිරිපිටින් වැටී ඇති අතර නැගෙනහිර දිශාවෙන් පාසල් සීමාවට යාබදව සීතාදේවි බාලිකා මහා විද්‍යාලය පිහිටා ඇත (රූපය 3: ගූගල් ඡායාරූපය, භූමි හරස්කඩ, භූමි පරිහරණය, අවදානම් අංගයන් සහ ස්ථානයෙහි විශේෂ ලක්ෂණ සහිත සථානයන් වල ඡායාරූප බලන්න).

#### 4.3 වර්තමාන අවදානම් ස්වභාවය

පාසල් පරිශ්‍රය තුළ ඇති අස්ථායී බෑවුම් කොටස් පාසල් සිසුන්ට දැඩි අවදානමක් ගෙන එනු ලබයි . එබැවින්, මෙම අවම කිරීමේ ස්ථානයේ වර්තමාන අවදානම් මට්ටම ඉතා ඉහළ ය. අනාගතයේ සිදු වන නාය යාම් වළක්වා ගැනීම සඳහා මෙම ස්ථානය පිළිසකර නොකළ හොත්, පස් කඳු සමඟ බෑවුම කඩා වැටීම හේතුවෙන් පාසලේ සියලුම කාර්යයන්ට බාධාවක් ඇති වනු ඇති අතර මෙම අස්ථායී බෑවුම් කොටස් හේතුවෙන් සිසුන්, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාසල් ක්‍රියාකාරකම් අවදානමට ලක් වනු ඇත. මෙය මහනුවර ප්‍රදේශයේ විශාලතම පාසලක් වන බැවින් බෑවුම් කඩා වැටීමේ අවදානම සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

## 5. ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන්

පාසල තුළ බෑවුම් බිඳවැටීම් සහ කැපුම් අසාර්ථක වීම් සඳහා ඉහළ සම්භාවිතාවයක් පවතින ස්ථාන දහයක් (10) හඳුනාගෙන ඇති අතර යෝජිත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තවදුරටත් බෑවුම් බිඳ වැටීම් වලක්වා ගැනීම සහතික කිරීමයි. එබැවින්, ප්‍රතිනිර්මාණය කිරීම, රැඳවුම් බිත්ති ඉදිකිරීම, පාංශු ඇණ ගැසීම, මතුපිට සහ උප මතුපිට ජලාපවහන වැඩිදියුණු කිරීම වැනි වැළැක්වීමේ පියවරයන් භාවිතා කරනු ලැබේ.

## 6. ව්‍යාපෘති ක්‍රියාවන් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී මූලද්‍රව්‍ය පිළිබඳ විශේෂ සඳහනක් සහිත අවට පරිසරය පිළිබඳ කෙටි විස්තරයක්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවදානමට ලක්ව ඇති කොටස් සහ සේවාවන් නම්;

i. පාසල් ළමුන්, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්

ii.පාසල් ගොඩනැගිලි සහ ව්‍යුහයන්

iii. A001 කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය

iv. සීතාදේවි බාලිකා මහා විද්‍යාලය සහ එහි සිසුන්, ගොඩනැගිලි

v. ප්‍රදේශයේ වත්මන් සේවා, ආර්ථික හා සංචාරක ක්‍රියාකාරකම්

*(රූපය.6 ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී අංග)*



රූපය *6a: 12* ශ්‍රේණියේ ටෙක් *2* ගොඩනැගිල්ල ඉදිරිපිට බෑවුම (සනීපාරක්ෂක පහසුකම් පිටුපස) *(L1)*



රූපය*64b:* වාණිජ ගොඩනැගිල්ල ඉදිරිපිට (සනීපාරක්ෂක පහසුකම් සහිත ස්ථානයට දකුණු පසින් *) (L2)*



රූපය *6c:* කලා ගොඩනැගිල්ල පිටුපස බෑවුම් කොටස *(L3)*



රූපය *6d: 12* ශ්‍රේණියේ තාක්ෂණික ගොඩනැගිල්ල සහ බුද්ධ ප්‍රතිමාව අතර බෑවුම *(L4)*



රූපය *6e:* ගුරු සනීපාරක්ෂක පහසුකම් සහ ගෘහ විද්‍යාගාරය පිටුපස බිඳවැටුණු මාර්ගය සහ බෑවුම් කොටස *(L5)*



රූපය *6f:* සී කොටසේ අංක *2* දරණ බාලක ස්නාන ස්ථානය ආසන්න පඩි පෙළ *(L6)*



රූපය *6g:* නේවාසිකාගාරය සහ පැරණි ආපන ශාලාව අතර ඉඩම් කොටස *(L7)*



රූපය *6h:* මුළුතැන්ගෙය සහ ක්‍රීඩා මණ්ඩපය අතර බෑවුම් කොටස*(L8)*



රූපය *6I:* නැටුම් කාමරය සහ අලුතින් ඉදිකරන ලද මහල් *4* ක ගොඩනැගිල්ල අතර අස්ථායී බිම් කොටස *(L9.)*



රූපය *6J:* ක්‍රීඩා මණ්ඩපය ආසන්නයේ බෑවුම *(L10)*

රූපය *6:* ව්‍යාපෘති ක්‍රියාවන්ට බලපෑම් කළ හැකි සංවේදී අංග

## 7. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම

### 7.1 හිතකර බලපෑම්

යෝජිත නාය යාම අවම කිරීමත් සමඟ බෑවුම් ස්ථායීතාවය වැඩිදියුණු වීම සිදු වන අතර එමගින් පාසල් ජනගහනයේ සහ දේපළවල ආරක්ෂාව සහ කොළඹ - නුවර-**A1** මාර්ගයේ මගීන්ගේ සහ පදිකයින්ගේ ආරක්ෂාව සැලකිය යුතු ලෙස වැඩි වීම සිදු වනු ඇත. කිංග්ස්වුඩ් විද්‍යාලයේ සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ ආරක්ෂාව කෙරෙහි මෙම ව්‍යාපෘතිය ප්‍රබල ධනාත්මක බලපෑමක් ඇති කරයි.

### 7.2 අහිතකර බලපෑම්

හානිය අවම කිරීමේ කටයුතු එම අස්ථාවර භූමි ප්‍රදේශයකට සීමා වේ. එබැවින් සෘණාත්මක බලපෑම් බොහෝ එම ස්ථානයට පමණක් සීමා වනු ඇති අතර ඉදිකිරීම් කාලයට පමණක් සීමා වේ.

**වගුව 1: සෘණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම**

| ඉදිකිරීම් කාලය තුළ විය හැකි බලපෑම් නිර්ණායක | බලපෑම් මට්ටම |
|---|---|
| **7.2.1** ජල විද්‍යාත්මක බලපෑම් | |
| **7.2.1.1** ප්‍රදේශයේ ජලාපවහන රටාව කෙරෙහි බලපෑම<br><br>භූමිය නැවත සකස් කිරීම, සුන්බුන් ඉවත් කිරීම සහ පිටාර ජලය හරවා යැවීම හේතුවෙන් ඉදිකිරීම් කාලය තුළ ප්‍රදේශයේ පවත්නා මතුපිට හා උප මතුපිට ජලාපවහන රටාව යම් තරමකට වෙස් වීම අපේක්ෂා කෙරේ. මෙම අවදානම් අවම කිරීමේ පාසල් පරිශ්‍රය තුළ ස්ථායිකරණ කටයුතු බොහෝ දුරට ජලාපවහනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. නෙත්ති කානු සහ උප පෘෂ්ඨීය කානු වැඩි වීම විමත් සමග වැසි කාලවලදී පහළ ප්‍රදේශයේ ගලායන ජලයේ ධාරිතාවය හා ගමන් කිරීමේ වේගය වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | **අතිශයින් වැදගත්** |
| **7.2.1.2** ජල දූෂණය සම්බන්ධයෙන් ඇති බලපෑම<br><br>බෑවුම් කැණීම් වලදී, සුන්බුන් ඉවත් කිරීමෙන් ඉහළ අවසාදිත ප්‍රමාණයක් ජනනය විය හැකිය. යන්ත්‍රෝපකරණ වලින් තෙල් හා වෙනත් හානිකර ද්‍රව්‍ය / අපවිත්‍ර ද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම, තාවකාලික ගබඩා ටැංකි වලින් කාන්දු වීම, ඝන අපද්‍රව්‍ය සහ අපජලය බැහැර කිරීම ජලයේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් ඇති කළ හැකිය..කෙසේ වෙතත්, වැසි සමයේදී, මෙම ඉදිකිරීම් සහිත බෑවුම හරහා දිවෙන වැසි ජලය අවසාදිත, තෙල් සහ ඉදිකිරීම් අතරතුර ජනනය වන අනෙකුත් දූෂක ද්‍රව්‍ය සමග ගලා ගොස් අපවිත්‍ර විය හැක. පාසල අසල ගංගා නොමැත, එබැවින් ජල දූෂණය සම්බන්ධයෙන් ඇති බලපෑම සැලකිය යුතු නොවේ | නොවැදගත් |
| **7.2.1.3** පාංශු ඛාදනයේ බලපෑම සහ ගංගා පතුළ වෙනස්වීම<br><br>ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලදී / ඉදිකිරීම් අවධියේදී මතුපිට ඛාදනය සඳහා බෑවුම විවෘත වීමක් සිදු විය හැක. ඉදිකිරීම් අදියරේදී ප්‍රදේශයේ පවතින මතුපිට හා උප මතුපිට ජලාපවහන රටාව වෙනස් වීමකට ලක් විය හැක. එබැවින් ඛාදන බලපෑම් සැලකිය යුතු ය. මෙම ස්ථානයේ අවම කිරීමේ කටයුතු මගින් බොහෝ දුරට ජලාපවහන වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එම නිසා වර්ෂා කාලයේදී දොළවලට එකතු වීම සඳහා බෝක්කු හරහා හෝ සෘජුවම නෙත්ති කානු හරහා අධික ජල ප්‍රවාහයක් ජනනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නමුත් පාසල අවට ඇළ දොළවල් නොමැති වීම නිසා ඉවුරු ඛාදනය, ගංගා පත්ලේ වෙනස් වීම් යනාදිය කෙරෙහි බලපෑමක් සිදු නොවේ. | නොවැදගත් |
| **7.2.1.4** අක්‍රමවත් වැසිකිලි භාවිතය නිසා ජලයෙන් පැතිරියහැකි ආසාධන<br>වැඩබිම ගොඩනැගිලි ආසන්නයේ ප්‍රදේශයක පිහිටා ඇති හෙයින් විවෘත මළපහ කිරීමේ හැකියාව අඩුය. තවද ප්‍රදේශය ඝන වෘක්ෂලතා ආවරණයකින් සමන්විත නොවන බැවින් කොන්ත්‍රාත්කරුගේ ශ්‍රම බලකාය විසින් විවෘත මලපහ කිරීම හේතුවෙන් ඉදිකිරීම් වලදී ඇළේ ජලය හෝ ගලා යන ජලය අපවිත්‍ර වීම අපේක්ෂා නොකෙරේ. | නොවැදගත් |
| **7.2.1.5** පහළ ප්‍රදේශයේ ජල පරිභෝජකයන්ට ඇති විය හැකි බලපෑම්<br>භූමියට ආසන්නව ජල ධාරාවන් නොමැති බැවින් බලපෑම වැදගත් නොවේ. | නොවැදගත් |

| | |
|---|---|
| **7.2.1.6** භූගත ජල මට්ටමට හා භූගත ජලයේ ගුණාත්මකභාවයට විය හැකි<br><br>සිමෙන්ති, ග්‍රවුට් ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍ය එකතු කිරීම හෝ මිශ්‍ර කිරීම මගින් , උප පෘෂ්ඨීය ජල ප්‍රවාහයන්හි ගුණාත්මකභාවය පිරිහීමට හා අනවශ්‍ය ද්‍රව්‍ය තැන්පත් වීම සිදුවිය හැක. ඉදිකිරීම් කාලය තුළ, රසායනික ද්‍රව්‍ය වලින් උපද්‍රවකාරී අපද්‍රව්‍ය, ඉදිකිරීම් කටයුතුවලින් අපජලය සහ වැඩබිම තුල පවතින මල/ අපජල පද්ධති වලින් අපද්‍රව්‍ය බැහැර කිරීම භූගත ජලයේ ගුණාත්මක භාවයට අහිතකර ලෙස බලපානු ඇත. | වැදගත් |
| **7.2.1.7** ජලය හෝ තෙත්බිම් වලට වන බලපෑම්<br><br>ව්‍යාපෘති භූමිය අවට ජල මාර්ග නොමැති බැවින් එයින් ඇති විය හැකි බලපෑම නොසැලකිය හැකිය. | නොවැදගත් |
| **7.2.2** පාරිසරික බලපෑම් | |
| **7.2.2.1** ශබ්දය හා කම්පන මගින් ඇති විය හැකි බලපෑම්<br>ඉදිකිරීම් උපකරණ වලින් ශබ්දය සහ කම්පනය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ස්ථානයේ සිට මීටර් **100** ඇතුලත සීමාවේ පාසල් දෙකක් පිහිටා ඇති බැවින් ශබ්ද සහ කම්පන මගින් ඇති කරන බලපෑම් සැලකිය යුතු ය. ඉහත සඳහන් ඉදිකිරීම් කටයුතුවලට අමතරව ද්‍රව්‍ය පැටවීම සහ බෑම ක්‍රියාත්මක කිරීම, යන්ත්‍ර සූත්‍ර ගෙනයාම වැනි අධික ශබ්ද උත්පාදන ක්‍රියාකාරකම් වලදී පාසල්වල සිසුන් අධික ශබ්දයට නිරාවරණය වේ. එමෙන්ම මාර්ගවල පදිකයින්ට සහ මගීන්ට ද ශබ්දය සහ කම්පනයෙන් බලපෑම් අතිවිය් හැක. එබැවින් ව්‍යාපෘතිය මගින් පාසල්වල ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු සෝෂාකාරී බලපෑමක් ඇති කරනු ඇත. | අතිශයින් වැදගත් |
| **7.2.2.2** වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම<br><br>වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් ලෙස ඉඩම් පිරිසිදු කිරීම, ඩීසල් එන්ජින් ක්‍රියාත්මක කිරීම, කඩා ඉවත් කිරීම් සහ ගිනි තැබීම වැනි ක්‍රියාවන් හැඳින්විය හැක , තවද වියළි කාලගුණික තත්ත්වයන් යටතේ අධික වේගයෙන් වාහන ධාවනය කිරීම මගින්ද වායු දූෂණය වැඩි විය හැකිය. ඉදිකිරීම් ද්‍රව්‍ය නිසි ලෙස ආවරණය නොකර තිබීම හා නිසි ලෙස ගබඩා නොකිරීමෙන් දූවිලි ජනනය විය හැකිය. ඉදිකිරීම් කටුයුතු සඳහා භාවිතා වන කොන්ක්‍රීට්, සිමෙන්ති, ලී, ගල් සහ සිලිකා වලින්ද සාමාන්‍යයෙන් ඉහළ මට්ටමේ දූවිලි ජනනය කරනු ලබයි. පාසල් ගොඩනැගිලි පරිශ්‍රය එම ව්‍යාපෘති භූමිය තුළ පිහිටා ඇති බැවින් වායු දූෂණය කෙරෙහි වන බලපෑම් ඉතා වැදගත් වේ. කොළඹ නුවර ප්‍රධාන මාර්ගය වාහන (බස්, බයිසිකල්, ලොරි, ට්‍රක්, ටිපර්, ත්‍රිරෝද) ධාවනය කිරීම සඳහා බහුලව භාවිතා වන බැවින් මගීන්ට සහ පදිකයින්ටද මෙම වායු දූෂණය සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. තවද පාසලේ සිසුන්, කාර්ය මණ්ඩලය සහ පාසලට පැමිණෙන දෙමාපියන් වායු දූෂණයෙන් පීඩාවට පත් වේ. පාසල් සිසුන්, මගීන් සහ කාර්ය මණ්ඩලය කෙරෙහි වියළි කාලවලදී ඉදිකිරීම් වලින් සිදුවන වායු දූෂණ බලපෑම් සමස්තයක් වශයෙන් වැදගත් වේ. | අතිශයින් වැදගත් |
| **7.2.2.3** ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු<br><br>ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම; ව්‍යාපෘති ස්ථානය අවට ජනනය අපද්‍රව්‍ය, ආහාර අපද්‍රව්‍ය, ඉදිකිරීම් අපද්‍රව්‍ය වැනි විවිධ වර්ගවල අපද්‍රව්‍ය ගබඩා කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කල හැකි අතර එම පරිශ්‍රයේ සහ අවට ඝන අපද්‍රව්‍ය ගබඩා කිරීම සහ බැහැර කිරීම සිසුන්ට, මගීන්ට, පදිකයින්ට, දෙමාපියන්ට සහ කාර්ය මණ්ඩලයට අපහසුතාවයක් ඇති කරයි. ඝන අපද්‍රව්‍ය මගින් ජලාපවහන මාර්ග අවහිර විය හැකි අතර එවිට ජලයෙන් බෝවන රෝග පතුරුවන ස්ථානයක් බවට පත් විය හැකිය . අපද්‍රව්‍ය මගින් පස දූෂණය විය හැකි අතර ඉදිකිරීම් කාලය තුළ නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් විවිධ පාරිසරික බලපෑම් ඇති විය හැකිය. | අතිශයින් වැදගත් |
| **7.2.2.4** පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය භාවිතය<br><br>නාය යාමට ලක් වූ ප්‍රදේශයේ පාෂාණ ගල් ඇති බැවින්, ගල් පිපිරවීම අපේක්ෂා කරන්නේ නම් පුපුරණ ද්‍රව්‍ය භාවිතා කළ හැකිය. බලපෑමට ලක් වූ බෑවුම්වල සහ පාසල් ගොඩනැගිලි ආසන්නයේ මෙම මෙහෙයුම් සිදු කිරීමට නියමිත බැවින් පුපුරණ ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කිරීමේ අවදානම සහ පාෂාණ කැබලිවලින් අනතුරු සිදුවීමේ අවදානම ඉතා වැදගත් වේ. | අතිශයින් වැදගත් |
| **7.2.3** ජීව විද්‍යාත්මක /පරිසර විද්‍යාත්මක බලපෑම | |

| | |
|---|---|
| **7.2.3.1** සැලකිය යුතු වනජීවී වාසස්ථානවල බලපෑම්<br><br>ව්‍යාපෘති බලපෑම් සහිත ප්‍රදේශය තුළ රක්ෂිත වනාන්තර/වනජීවී සංරක්ෂිත ප්‍රදේශ ජෛව විවිධත්වය හෝ සංවේදී පරිසර පද්ධති, වාසස්ථාන ඇතුළත් ප්‍රදේශ නොමැත | නොවැදගත් |
| **7.2.3.2** සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි බලපෑම්<br><br>ව්‍යාපෘති භූමියේ ඇති ශාක කිසිවක් ආවේණික, තර්ජනයට ලක්වන සහ IUCN හි රතු ලැයිස්තුවේ හඳුනාගත් ශාක නොනොමැත. | නොවැදගත් |
| **7.2.4 සාමාජීය හා ආර්ථික බලපෑම්** | |
| **7.2.4.1** ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම්<br>ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම් නොමැත | නොවැදගත් |
| **7.2.4.2 කම්පන නිසා ගොඩනැගිලි වලට විය හැකි බලපෑම**<br><br>අස්ථායී බෑවුම පාසල් පරිශ්‍රයක් තුළ පිහිටා ඇති අතර පාසල් ගොඩනැගිලි පිහිටා ඇත්තේ යෝජිත අවම කිරීමේ ස්ථානයට ආසන්නයේ ය. එබැවින් ගොඩනැගිලි මත කම්පනයෙන් සිදුවන බලපෑම ඉතා වැදගත් වේ. ඉදිකිරීම් අතරතුර බර යන්ත්‍රෝපකරණ භාවිතා කරනු ඇති අතර කම්පනය මඟින් මෙම ගොඩනැගිලිවල ඉරිතැලීම් ඇති විය හැකි අතර එහි බලපෑම සැලකිය යුතු ය. කම්පනය පාසලේ බෑවුමට ආසන්නව පිහිටි ගොඩනැගිලිවල ස්ථායිතාවයට බලපායි. | වැදගත් |
| **7.2.4.3 භූමියට සහ අනාගත සංවර්ධන කටයුතුවලට ප්‍රවේශය අහිමි වීම**<br><br>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වේ. අවම කිරීමේ කටයුතු පාසල් ගොඩනැගිලිවලට යාබද අස්ථායී බෑවුම් ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන සිදු කරනු ලබයි. මෙම ප්‍රදේශය ප්‍රධාන වශයෙන් පොදු පරිශ්‍රයක් වන අතර, ඉඩමට ප්‍රවේශය අහිමි වීම (ඉදිකිරීමේදී) සහ ඉදිකිරීම් භූමියට ආසන්නයේ ඇති ගොඩනැගිලිවල සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සිදු කිරීම අහිමිවීම සම්බන්ධයෙන් පාසලට යම් බලපෑම් ඇතිවේ. ඊට ප්‍රතිවිරුද්ධව , අස්ථායී බෑවුම ස්ථායි කිරීම මගින් ගොඩනැගිලිවල ස්ථාවරත්වය වැඩි කරන අතර අනාගත අසාර්ථකත්වයන්ගෙන් භූමිය ආරක්ෂා කරනු ඇත. | වැදගත් |
| **7.2.4.4 ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම්**<br><br>ජීවනෝපාය ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් මෙම අස්ථාවර භූමිය සහ පිහිටා නොමැත. | නොවැදගත් |
| **7.2.4.5 සේවා සැපයීම කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් (ජල සැපයුම, අපද්‍රව්‍ය විදුලිය)**<br><br>පාසලට ජල පහසුකම් සපයන ජල මාර්ග අස්ථායී බෑවුම් ආසන්නයේ පිහිටා ඇති බැවින් ඉදිකිරීම් කාලයේදී ඒවා කෙරෙහි බලපෑම් ඇති වනු ඇත. | වැදගත් |
| **7.2.4.6 යටිතල පහසුකම් අහිමි වීම සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන බලපෑම**<br>පාසලට පිවිසෙන මාර්ගය ඉතා පටු බැවින් ඉදිකිරීම් අදියරේදී නිතර ගමන් කරන යන්ත්‍රෝපකරණ, ලෝඩර් හා ට්‍රක් රථ ආදියෙන් A1 කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය අවහිර වනු ඇත. එබැවින් , අධික බර යන්ත්‍රෝපකරණ, ට්‍රක් රථ සහ පැටවුම් පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති කරන අතර පාසල ආරම්භක සහ අවසාන වන කාල සීමාවේදී වාහන තදබදයක් ඇති විය හැක. | වැදගත් |
| **7.2.4.7 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්**<br>ඉදිකිරීම් කටුයතු වෙනුවෙන් පැමිණෙන කම්කරුවන්ගේ තාවකාලික නේවාසික ස්ථාන බොහෝවිට ව්‍යාපෘති භූමියට ඉතා ආසන්නයේ ඉදි කරනු ඇත. එසේ නොවුනහොත් ඇතැම්විට කොන්ත්‍රාත්කරු ආසන්නයේ ඇති නිවසක් හෝ කුලී පදනමින් සපසා ගනු ඇත. විධිමත් නේවාසික ස්ථාන කළමනාකරණ ක්‍රමවේද අනුගමනය නොකලහොත් කම්කරු ගැටළු, පොදු පහසුනම් භුවමාරු කර ගැනීමේදී නොසන්සුන් තත්ත්වයන්, ඔවුන් අතර ඇතැම් සමාජ ගැටළු හා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ගැටළු ඇතිවීමට ඇති ඉඩකඩ ඉහළය. එම නිසා මේ සම්බන්ධයෙන් ඇති බලපෑම සැලකිය යුතු ය. | වැදගත් |

| | |
|---|---|
| **7.2.4.8** කම්කරුවන් සහ පාසල් ළමුන් / කාර්ය මණ්ඩලය ව්‍යාපෘති භූමිය අවට ජීවත් වන පුද්ගලයින් අතර සම්බන්ධතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව<br><br>නායයාම් ආපදාව අවම කිරීමේ ස්ථානය පාසලකි. මෙම ස්ථානයේ ඉදිකිරීම් සිදු කරනු ලබන කම්කරුවන් විවිධ සමාජ පසුබිම හා දරිද්‍රතාවයන්ට යටත්ව විවිධ ප්‍රදේශ වල සිට පැමිණෙන පිරිස් වනු අත. සාමාන්‍යයෙන් ඔවුන් සිටින්නේ දුර්වල අධ්‍යාපනික හා සමාජ පසුබිමක ය. එවැනි ප්‍රජාවන්ගේ පවතින පුළුල් පරාසයක සමාජ ගැටලු හේතුවෙන් පහත දක්වා ඇති පරිදි පාසල් කාර්ය මණ්ඩලයට සහ ළමයින්ට විවිධ ගැටළු ඇතිවීමේ හැකියාවක් පවතී.<br><br>• පාසැලේ විධිමත් ක්‍රියාකාරීත්වය සඳහා බාධාවන් වීම<br>• පාසල් භූමියට අනවසර පිවිසුම<br>• දරුවන්ට උසුළු විසුළු කිරීම හා හිරිහැර කිරීම<br>• දරුවන් හා දෙමව්පියන් සමග ගැටුම් ඇති වීම<br>• සිතේ එකග බවකින් යුතුව දරුවන්ට අධ්‍යාපනයේ යෙදීමට නොහැකි වීම<br>• දූෂිත ගනුදෙනු සඳහා දරුවන් හා දෙමව්පියන් පෙළඹවීම<br>• අවිධිමත් ලෙස ළමා ශ්‍රමය ලබා ගැනීම<br>• ශ්‍රම බලකාය විසින් පාසලේ සනීපාරක්ෂක පහසුකම් භාවිතා කිරීම<br>• පාසල් ලමුන්ට ලිංගික අපයෝජන සිදු වීම<br><br>එවැනි ගැටලුවලට සම්බන්ධ වන කම්කරුවන් දුර්ලභ වුවද සමහර අවස්ථාවන් නොසලකා හැරිය නොහැකිය. එමනිසා, මෙම ව්‍යපෘති ස්ථානයේ සමාජ සහ ප්‍රජා ගැටළු **අතිශයින් වැදගත් වනු ඇත** | **අතිශයින් වැදගත්** |
| **7.2.4.9** ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව<br><br>කම්කරුවන් අස්ථායි බෑවුමෙන් වැටීමේ අවදානමට නිරාවරණය විය හැකි අතර බෑවුම අසමත් වුවහොත් මාරාන්තික තුවාල පවා සිදුවිය හැකිය. වැසි සමයේදී බෑවුම් අසාර්ථක වීමේ අවදානම ඉහළ වේ. එබැවින් මෙමගින් සිදුවන අවදානම ඉතා වැදගත් වේ. වාහන හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ වලින් අනතුරු විය හැකි අවදානම මෙම ස්ථානයේදී අතිශයින් වැදගත් වේ. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු සඳහා අඩු වයස් කම්කරුවන් (ළමයින්) වැඩ කිරීම සඳහා යෙදවිය හැකි අතර එමගින් බරපතල අනතුරු හා තුවාල සිදුවිය හැක. | **අතිශයින් වැදගත්** |
| **7.2.4.10** ඉදිකිරීම් **අතරතුර පාසල් ළමුන්** ව්‍යාපෘති භූමියට **පිවිසීමේ අවදානම**<br>ඉදිකිරීම් අදියරේදී පාසල් පරිශ්‍රයට නිතර ගමන් කරන යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදියෙන් බාධා ඇති වේ. අවම කිරීමේ කටයුතු බොහොමයක් බෑවුම්වල සහ පාසල් පරිශ්‍රයේ සීමිත ඉඩ ප්‍රමාණයක සිදු කිරීමට නියමිත බැවින් බර යන්ත්‍රෝපකරණ, ට්‍රක් රථ සහ පැටවුම් යනාදිය හේතුවෙන් පාසල වෙත ගමන් කිරීමට බාධා ඇති කළ හැක. මෙමගින් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයේ ජීවිතයට ඉහළ අවදානමක් ඇති කළ හැකි අතර ඉදිකිරීම් අදියරේදී ඔවුන් මෙම අවදානමට දීර්ඝ කාලයක් නිරාවරණය වනු ඇත. කැණීම් සහ ගල් ඉවත් කිරීමේදී යෝජිත ස්ථානයට ලිහිල් ගල් කඩා වැටීමේ අවදානම හේතුවෙන්ද සිසුන්ට අවදානමක් ඇති වේ. එබැවින් ඔවුන් මත ඇති අවදානම ඉතා වැදගත් වේ | **අතිශයින් වැදගත්** |
| **7.2.4.11** ප්‍රවාහන යටිතල **පහසුකම් කෙරෙහි ඇතිවන බලපෑම් (විශේෂයෙන් මාර්ග හෝ දුම්රිය ප්‍රවේශය** තාවකාලිකව **අහිමි වීම, මාර්ග තදබදය මගින් ඇතිවන අවදානම)**<br><br>මාර්ගය සම්පූර්ණයෙන්/අර්ධ වශයෙන් වසා දැමීම හේතුවෙන් සතියේ දිනවල, කාර්යාල වේලාවන්හි, පාසල් වේලාවන්හි හා උත්සව දිනවලදී වාහනවල ගමනාගමනයට බාධා ඇති විය හැකිය. මෙමගින් පදිකයින් සහ මගීන් අපහසුතාවයට පත් වේ. | වැදගත් |
| **7.2.4.12** පිළියම් යෙදිය යුතු ප්‍රදේශය තුල පවතින ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු<br><br>පිළියම් යෙදිය යුතු ප්‍රදේශය ව්‍යාපාර, විශේෂිත කෘෂිකාර්මික පිළිවෙත් හෝ වෙනත් කටයුතු සඳහා භාවිතා නොවේ. | නොවැදගත් |
| **7.2.4.13** පිළියම් යෙදිය යුතු ප්‍රදේශය ආසන්නයේ පවතින ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු<br><br>පිළියම් යෙදිය යුතු ප්‍රදේශය ආසන්නයේ ව්‍යාපාර, විශේෂිත කෘෂිකාර්මික පිළිවෙත් හෝ වෙනත් කටයුතු සඳහා භාවිතා නොවේ | නොවැදගත් |

| | |
|---|---|
| **7.2.4.14** වැඩ බිම තුළට ශිෂ්‍යන්, පාසල් කාර්ය මණ්ඩලය සහ ප්‍රදේශවාසීන් ඇතුළු වීම නිසා ඇතිවන අවදානම<br><br>පාසල් සිසුන් සහ කාර්ය මණ්ඩලය ගමන් කරන පාසල් පරිශ්‍රයේ කැණීම් යන්ත්‍රෝපකරණ, පැටවුම් , ට්‍රක් රථ ආදිය භාවිතා කරනු ලබන අතර සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට මෙම වැඩ බිම තුලට ඇතුළු වීමට විශේෂ අවශ්‍යතාවක් නොමැත . තවද ඉදිකිරීම් සඳහා ලෝහ සමුච්චිත, වානේ වැනි ද්‍රව්‍ය භාවිතා කළ හැකි අතර ඒවා නුසුදුසු ලෙස ගබඩා කිරීම සහ හැසිරවීම යටතේ හානිකර විය හැකිය. කෙසේ වෙතත්, සාමාන්‍ය පුද්ගලයින්ට අනවසරයෙන් ඇතුළුවීම හිතාමතා හෝ නොදැනුවත්ව සිදුවිය හැකි අතර මෙහෙයුම් යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය සහ ඒවා පුපුරන ද්‍රව්‍ය නිසා අවදානමට ලක්විය හැකිය. | **අතිශයින් වැදගත්** |

**8.** **සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම්: NBRO සහ කොන්ත්‍රාත්කරුගේ පාර්ශව වලින් විශේෂ ක්‍රියාමාර්ග අවශ්‍ය වන සමාජ හෝ පාරිසරික බලපෑම් හෝ අවදානම් සහිත අවස්ථා**

සැලකිය යුතු බලපෑම් පෙන්නුම් කරයි

**8.1 සැලකිය යුතු පාරිසරික හා සමාජ බලපෑම්**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (**NBRO**) හි විශේෂ අවධානයක් අවශ්‍ය වන පාරිසරික, සමාජීය බලපෑම් හෝ අවදානම් තත්වයන්.

**8.2** සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඩ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය: කොන්තාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබද කරුණු

අස්ථායි වී ඇති බැවුම් ප්‍රදේශයක අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂා කරණ බැවින් බැවුමේ අස්ථායිතාවයේ ක්‍රියාකාරිත්වය නිසා ඉදිකිරීම් ශ්‍රම බලකාය මුහුණ පෑ හැකි අවදානම ඉහළ ය. **ESMF** හීදී එවන් පොදු **E & HS** ගැටළු සාකච්ජා කර ඇත. ඉදිකිරීම් වැඩ බිමෙහි සේවක ආරක්ෂක අවශ්‍යතාවයන් ලංසු පත්‍රිකාවේ **2003** කොටස: වැඩ කරණ තත්වයන් සහ ප්‍රජා සෞඛ්‍යය හා ආරක්ෂාව හි **2003 5:** ආරක්ෂක උපකරණ සහ ඇඳුම් යන යටතේ වඩාත් විස්තර කර ඇත.

**8.3 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම**

වැඩ කරණ තත්ත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව චක්‍ර ලේඛනයේ 2003.3 වගන්තියට අනුව ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීම සවිස්තරාත්මකව දක්වා ඇත.

**9. පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESMP)**

7 සහ 8 වැනි කොටස් වලදී හඳුනාගන්නා ලද බලපෑම් සහ අවදානම් විශේෂයෙන් සලකා බලමින් එම බලපෑම් සහ අවදානම් තත්වයන් කළමනාකරණය කිරීමට හෝ අවම කිරීමේ ක්‍රියාමාර්ග. මෙය ESMP හි ඇති විශේෂිත නිර්දේශ සහ අවශ්‍යතා වල ඇතුළත් වනු ඇත.

**9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම**

මෙම භූමියෙහි ව්‍යාපෘතිය පාදක කරගත් නැවත පදිංචි කිරීමක් නොමැත. බර යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක වීමෙන් ඇතිවන භූ කම්පනය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාවන් වලදී ගොඩනැගිලිවලට ව්‍යුහාත්මක ස්වරූපයෙන් යම් බලපෑම් ඇති විය හැක.(ව්‍යාපෘතිය හේතුවෙන් ව්‍යුහයන්ට සිදුවන හානි සඳහා වන්දි යෝජනා ක්‍රමයක් සැකසිය යුතුය). (යොමු කිරීම 2002-2 17 ESMP යටතේ උපයුක්තතා සහ මාර්ග පහසුකම් සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතා)

**9.2 පදිංචි ජනතාව ඉවත් කිරීම**

මෙම භූමිය සඳහා ව්‍යාපෘති පාදක කරගත් ඉවත් කිරීම් අවශ්‍ය නොවේ

**9.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය)**

මෙම ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශයේ එවැනි ව්‍යුහයන් ඉවත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත

**9.4 ව්‍යාපෘතිය ක්‍රියාමාර්ග හේතුවෙන් දේපල/භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ගෙවීම**

ව්‍යාපෘති ක්‍රියාමාර්ග හේතුවෙන් ජල සැපයුම් මාර්ග වලට හානි කිරීම නිසා සිදු වන පාඩු සඳහා වන්දි ගෙවීමට සිදු විය හැකිය. එසේම, පාසලට අඛණ්ඩ ජල සැපයුම පවත්වා ගැනීම සඳහා විකල්ප ජල ප්‍රභවයන් සැපයීමට අවශ්‍ය විය හැකිය. ස්ථානය ඉදිකිරීමට පෙර ඉංජිනේරුවරයා මේ පිළිබඳව පාසල් කළමනාකාරිත්වයෙන් උපදෙස් ලබා ගත යුතුය.

**9.5 පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම**

i. නාය යෑමෙන් ඇති විය හැකි අවදානම් පිළිබඳව විශේෂයෙන් අවට පදිංචිකරුවන්, පාසල් සිසුන්, ගුරුවරුන් සහ කිංග්ස්වුඩ් විද්‍යාලයේ දෙමාපියන් දැනුවත් කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.

ii. ඉදිකිරීම් අදියරේදී සහ පූර්ව අනතුරු ඇඟවීමේ අවදානමක් ඇති කොළඹ-මහනුවර මාර්ගය භාවිතා කරන මගීන් සහ එම ප්‍රදේශය හරහා ගමන් කරන ජනතාව සඳහා විශේෂ දැනුවත් කිරීමක් අවශ්‍ය වේ.

**9.6 සැළසුම් මත පදනම් වූ පාරිසරික සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම**

මෙම ව්‍යාපෘති භූමිය ග්‍රාමීය වටපිටාවක් සහිත සෞන්දර්යාත්මක සුන්දර, පරිසර සංවේදී, ස්වභාවික පරිසරයක පිහිටා ඇත. එබැවින්, පාරිසරික හා සමාජීය වශයෙන් වැදගත් සැලසුම් සලකා බැලීම් අනුගමනය කිරීම නිර්දේශ කරනු ලැබේ.

වගුව **2:** සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම

| **සැළසුම් අංගය** | **මෙම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා සලකා බැලීම වන නිර්දේශිත මට්ටම.** |
|---|---|
| i. **ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ත ලෙස සැළසුම් කරණය**<br><br>ශාක විශේෂයන් ඉවත් කිරීම අවම කිරීම සඳහා වන ව්‍යාපෘති විශේෂිත සැළසුම් සැලකිල්ලට ගත යුතුය. වැදගත් ශාක විශේෂ වෘක්ෂලතා ආවරණය සමග බැඳී ඇත්නම් ශාක සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් අවදානයක් යොමු කල යුතුය | මධ්‍ය |
| **ii.** වැඩබිම සැළසුම් කිරීම<br><br>ව්‍යාපෘති ස්ථානය සැළසුම් කිරීමේදී බෑවුම් අස්ථාවර වීම පිළිබඳව ප්‍රවේසම් විය යුතුය. එසේම ව්‍යාපෘති ස්ථානය පිහිටා ඇත්තේද පාසල ආශ්‍රිතව ඉතා සීමිත ඉඩකය. එබැවින් වාහන නැවැත්වීමේ ස්ථාන, ද්‍රව්‍ය ගබඩා කිරීම සහ තාවකාලික කුඩාරම් ආදිය අනතුරුදායක කලාපවල ස්ථාපනය නොකළ යුතුය. ඉදිකිරීම් කාලය තුළ පුහුණු කොඩිකරු හෝ ආරක්ෂක නිලධාරියෙකු තබා ගැනීම ඉතා අවශ්‍ය වන අතර කොන්ත්‍රාත්කරුගේ ශ්‍රම බලකාය සහ අනෙකුත් වගකිවයුතු නිලධාරීන් අතර නිසි සන්නිවේදනයක් පවත්වා ගත යුතුය. | ඉතා ඉහල |

| | |
|---|---|
| iii. **වාසස්ථාන සම්බන්ධතා සහ සත්ත්ව මංපෙත්**<br><br>ස්ථිර ඉදිකිරීම් සඳහා, ව්‍යාපෘතියට පිවිසීමට, ගැඹුරු කානු පද්ධති ආදිය සඳහා හෝ විශාල වශයෙන් වනාන්තර කොටස් ඉවත් කිරීමට සිදුවන්නේ නම් සැළසුම් තුළ සත්ව වාසස්ථාන අතර සම්බන්ධතා නොබිඳෙන ලෙස පවත්වා ගැනීමට සත්ව මංපෙත්, වෘක්ෂලතා තීරු ආදිය ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. | අවම |
| **iv. ජල සම්පත සංරක්ෂණය**<br><br>අභ්‍යන්තරයේ ඇති ජලය සාපේක්ෂ වශයෙන් හොඳ ගුනත්වයෙන් පවතීනම් භූමිය ස්ථාවර කිරීමේ ක්‍රමවේදයන් වලදී මෙම ජලය පිටතට ගනු ලබන අතර, එම ජලය පාසලේ ගෙවතු වගාව සහ සනීපාරක්ෂක කටයුතු සඳහා මූලාශ්‍රයක් ලෙස යොදා ගත හැක. | අවම |
| **v. ජල සැපයුමට බාධා**<br><br>අවදානම අවම කරන ලද බෑවුමේ ඇති ජලය ජල ප්‍රභවයක් ලෙස භාවිතා කරන්නේ නම්, ජල මට්ටම පහත වැටීම හේතුවෙන් මෙම ඉදි කිරීමේ කාර්යය මගින් ජල ප්‍රභවයට බලපෑම් ඇති වීමේ සම්භාවිතාව ඉහළ ය. එවැනි අවස්ථාවන්හිදී පාසල් ප්‍රජාව සඳහා විකල්ප ජල මූලාශ්‍ර (තාවකාලික/හෝ ස්ථිර) සකස් කළ යුතුය. | ඉහල |
| **vi. ස්වභාව සෞන්දර්යාත්මකව ගැලපෙන සැළසුම් සලකා බැලීම**<br><br>සෞන්දර්යාත්මක සංවේදී පරිසර නිර්මාණයේදී ස්වභාවික පරිසරය හා සංකලණය වන එමෙන්ම දෘශ්‍ය දූෂණය (ඇසට ප්‍රියමනාප විය යුතුය) අවම වන ලෙස ව්‍යුහයන් සැළසුම් කිරීමට සැලකිලිමත් විය යුතුය. යෝජිත අවම කිරීමේ ස්ථානය පොදු පරිශ්‍රයක පිහිටා ඇති බැවින්, ප්‍රදේශය සෞන්දර්යාත්මකව ප්‍රසන්න පරිසරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඉදිකිරීම් කටයුතුවලදී හරිතකරණය භාවිතා කළ හැකිය. ඒ සඳහා සුදුසු ස්ථායී ව්‍යුහයන් නිර්මාණය කිරීම සඳහා භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සේවය වැදගත් වේ. | ඉතා ඉහල |
| **vii. හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br><br>අවධානම අවම කිරීමේ කටයුතු බොහොමයක් පාරිසරික වශයෙන් සංවේදී වාසස්ථානවල සිදු කරනු ලබන බැවින්, සැලසුම්වලදී හැකිතාක් හරිත පාරිසරික සැලසුම් සලකා බැලීම අනුමත කරනු ලැබේ. උදා: ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම, පරිසරයේ විශේෂ විවිධත්වය පවත්වා ගැනීම සඳහා ශාක සංයෝජනය. , විභව ආක්‍රමණශීලී විශේෂ ඇතුළත් කිරීම වැළැක්වීම සහ යනාදිය. | ඉතා ඉහල |
| **viii. සමාජ හා සංස්කෘතික ලක්ෂණ සංරක්ෂණය**<br><br>දේශීය සංස්කෘතීන් සහ උරුමයන් ශක්තිමත් වන්නේ ඒවා පවත්වා ගෙන යන ස්වභාවික පරිසරය සමඟ ඇති සමීප සම්බන්ධතා මගිනි. එබැවින් ව්‍යාපෘති ක්‍රියාවන් දේශීය සංස්කෘතිය හා සමාජීය අංගයන් සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති ක්‍රියාවන් වලදී ඒවා ශක්තිමත් කිරීමට අවස්ථාව සලසා දීම සිදු කළ යුතුය.. | අවම |
| ix.**ඉදිකිරීම් කටයුතු වලදී සේවකයින්/පාසල් ළමුන් සහ අවට ප්‍රජාවගේ ආරක්ෂාව**<br><br>යෝජිත අවම කිරීමේ ස්ථානයේ ඇති සීමිත ඉඩකඩ හේතුවෙන් ඉදිකිරීම් අදියරේදී මිනිසුන්ට විශේෂයෙන් ශ්‍රම බලකායට අනතුරු වලට මුහුණ දීමට සිදුවිය හැකිය. අනවසරයෙන් ඇතුළුවීම සහ නොදැනුවත්කම හේතුවෙන් මෙම භූමිය අවට දරුණු අනතුරු ඇති විය හැකිය. ඉදිකිරීම් අදියරේදී නාය යම් හෝ බිම් ගිලා බැසීම් සක්‍රියවීම් සිදුවිය හැකි අතර එමගින් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට තර්ජනයක් විය හැකිය. එබැවින්, පාසල් දරුවන්ගේ ආරක්ෂාව සඳහා විශේෂිත වූ බාල්ක, ආරක්ෂිත දැල් වැනි සැලසුම් මත පදනම් වූ ආරක්ෂණ සලකා බැලීම් සැලකිල්ලට ගත යුතුය. | ඉතා ඉහල |
| **X. ඛාදනය පාලනය සඳහා වන ක්‍රියාමාර්ගයන්**<br><br>වැසි කාලවලදී මෙම ජලාපවහනයෙහි ගලා එමේ වේගය සැලකිය යුතු ලෙස ඉහළ යා හැක. එමෙන්ම වැසි සමයේදී අස්ථායී බෑවුම් හරහා මතුපිට ජලය අධික ලෙස ගලායාම අපේක්ෂා කළ හැකිය. මෙම ජලය අසල ඇති වැසි ජල කාණු වෙත ගෙන යා යුතුය. එබැවින් පාසල තුළ ඇති බෑවුම්වල ඛාදන ප්‍රවාහ අවම කිරීම සඳහා බාධකයන් ප්‍රමාණවත් ලෙස යොදා ගැනීමට සැලකිලිමත් විය යුතුය. | ඉහල |

| xi.අවම පසු නඩත්තු කිරීම් සහ සහ මෙහෙයුම් සැළසුම් කිරීම<br><br>හානිය අවම කිරීමේ කාර්යයේදී ජලාපවහන කළමණාකරණය සඳහා ගුරුත්ව කාණු වැනි අක්‍රිය ශිල්ප ක්‍රම සලකා බැලිය යුතුය. කාණු ඇහිරී යාම වළක්වා ගැනීම සඳහා නිවැරදි පයිප්ප විෂ්කම්භය, සිදුරු වල විෂ්කම්භ සහ ඇතිරීමේ ආනතිය නිවැරදිව සලකා බැලිය යුතුය. කානු ජලය ස්වාභාවික ජල දහරාවන්ට එකතු කරවීමට අපේක්ෂා කරණ්නේ නම්, බාදනයට ඔරොත්තු දෙන, රොන් මඩ රඳවා ගැනීමේ පද්ධති ආදී නොයෙක් නඩත්තු ව්‍යුහ සැළසුම් කළ යුතුය.<br>විවිධ කාලපරිච්ඡේදයන් තුළ දේශීය කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ව්‍යුහයන් සඳහා භාවිතා කරණ ද්‍රව්‍ය ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිතා කිරීමේදී විශේෂයෙන් බාදන වැලකීමේ තාක්ෂණික ක්‍රම සැළසුම් කළ යුතු අතර සියුම් රොන්මඩ උප නළ මාර්ග වලට කාන්දු වීම වැළැක්වීමට පියවර ගත යුතුය. | ඉතා ඉහල |
|---|---|

**9.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම**

**9.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන්**

පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය හා අවම කිරීම සඳහා වන පියවර සාමාන්‍යයෙන් සෑම ව්‍යාපෘති ස්ථානයකටම පොදු ය. පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලූ නායයාම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ කටයුතු වල ක්‍රියාකාරිත්වයට හේතු වේ. එබැවින් ඉදිකිරීමේදී වන බලපෑම අවම කිරීම කොන්ත්‍රාත්කරුගේ යුතුකමකි. ඉදිකිරීම් අදියරේදී කොත්‍රාත්කරුවන්ගේ ලංසු පත්‍රිකාවේ ඇතුලත් කර ඇති පාරිසරික, සමාජ, සෞඛ්‍යය සහ ආරක්ෂණ (ES & HS) කළමනාකරණයට අනුකූලව කොත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය කෙසේ විය යුතුද යන්න පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිර්දේශ කර ඇත. මෙම කොටස සඳහා අදාළ අංශවල ගුණාත්මක බව දැක්වෙන ප්‍රධාන කොටස් පහත දක්වා ඇත(වගුව 3). විස්තර සඳහා, ESMP ඉදිකිරීම් කොත්‍රාත්කරුවන් සඳහා යොමු කළ යුතුය.

වගුව **3: පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන්** ES & HS

| **පාරිසරික සමාජයීය කළමනාකරණ සැළසුමට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දක්වන එකඟතාවය** | **අයිතමය** | **ව්‍යෘපෘතිය සඳහා අදාලත්වය** |
|---|---|---|
| **2002. පාරිසරික හා සමාජ අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩ බිම තුල ගබඩා කිරීම | **අතිශයින්ම අදාල වේ** (පාසල් පරිශ්‍රය) |
| 2002.2 2) | ශබ්ධය සහ කම්පන | **අතිශයින්ම අදාල වේ** (පාසල් පරිශ්‍රය) |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරිතැලීම් සහ හානි සිදුවීම | **අතිශයින්ම අදාල වේ** (ගොඩනැගිලි) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | **අතිශයින්ම අදාල වේ** (පාසල් පරිශ්‍රය) |
| 2002.2 5) | කසල බැහැර කිරීම | **අතිශයින්ම අදාල වේ** (පාසල් පරිශ්‍රය) |
| 2002.2 6) | දූවිලි පාලනය | **අතිශයින්ම අදාල වේ** (පාසල් පරිශ්‍රය) |
| 2002.2 7) | ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කසල ප්‍රවාහනය | **අතිශයින්ම අදාල වේ** (මාර්ග වෙන් කිරීම, මගීන්, පදිකයින්) |
| 2002.2 8) | ජලය | අදාල වේ |
| 2002.2 9) | ශාඛ සහ සතුන් | **අදාල විය හැකිය** |
| 2002.2 10) | භෞතික සහ සංස්කෘතිකමය සම්පත් | අදාල වේ |
| 2002.2 11) | පාංශු බාධනය | **අතිශයින්ම අදාල වේ** |
| 2002.2 12) | පස සමඟ මිශ්‍ර වීම | අදාල වේ |
| 2002.2 13) | පොලොව හැරීම | අදාල වේ |
| 2002.2 14) | ගල් කොරි ක්‍රියාකාරකම් | අදාල නොවේ |

| | | |
|---|---|---|
| 2002.2 15) | නඩත්තු වාහන සහ යන්ත්‍රෝපකරණ | **අතිශයින්ම අදාල වේ** |
| 2002.2 16) | මහජන පීඩා | **අතිශයින්ම අදාල වේ** |
| 2002.2 17) | උපයෝගීතා සේවා හා පහසුකම් | **අතිශයින්ම අදාල වේ** |
| 2002.2 18) | දෘෂ්‍ය පරිසරය වැඩිදියුණු කිරීම | **අතිශයින්ම අදාල වේ** |
| **2002-5.** පාරිසරික අධීක්ෂණය | මූලික සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරිතැලීම් සමීක්ෂණ) | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | ඉදිකිරීම් අතරතුර සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරිතැලීම් සමීක්ෂණ) | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | මෙහෙයුම් කාලය තුල වැඩබිම් සමීක්ෂන | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | වාර්තා තැබීම හා පවත්වාගෙන යාම | අදාල වේ |
| **2003**. වැඩබිම් කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව | | |
| 2003.2 | ආරක්ෂක ක්‍රම සංවිධානය සහ සන්නිවේදනය | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| 2003.3 | ළමා ශ්‍රමය හා බලකිරීම | **අතිශයින්ම අදාල වේ** පාසල් පරිශ්‍රය) |
| 2003.4 | ආරක්ෂාව පිළිබ`ද වාර්තා සහ අනතුරු සහ ඒ පිළිබ`ද දැනුම්දීම | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| 2003.5 | ආරක්ෂක උපකරණ සහ ඇදුම් පැලදුම් | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| 2003.6 | ආරක්ෂක තත්ත්වය පරීක්ෂාව | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| 2003.8 | සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබ`ද තොරතුරු සහ පුහුණුව | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| 2003.9 | යන්ත්‍රෝපකරණ සහ සුදුසුකම් ලත් පුද්ගලයින් | **අතිශයින්ම අදාල වේ** (පාසල් දරුවන්, කම්කරුවන්) |
| **අදාල වේ** : ඕනෑම ඉදිකිරීම් ප්‍රදේශයක් සඳහා මෙය අදාල කරගත හැක. ( ***ESMP)***<br>**අතිශයින්ම අදාල වේ** : අදාල ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී ලෙස නිර්මාණය කරණ ලද පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම් සඳහා තහවුරු කිරීමට කොන්ත්‍රාත්කරු විශේෂයෙන් පාරිසරික ක්‍රමවේදයක් ලෙස අවධාරණය කළ යුතුය.<br>**අදාල විය හැකිය** : ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර ඉදිකිරීම් ප්‍රදේශයේ අදාල අංශයන් අවධානය යොමු වුවහොත් පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම් මගින් ක්‍රියාත්මක කල හැක.<br>**අදාල නොවේ :** අනාවරණය වූ කොන්දේසි මත මෙම ඉදිකිරීම් ප්‍රදේශයට අදාල නොවේ.<br>**විකල්ප:** අවශ්‍යතාවයන් මත ක්‍රියාත්මක වේ.<br>ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී වූ අධීක්ෂණ සැලසුම් යොමු කිරීම. ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී වූ අධීක්ෂණ සැලසම්වලට අනුව කොන්ත්‍රාත්කරු අධීක්ෂණ කටයුතු සිදු කිරීමට බැදී සිටී.<br>මූලාශ්‍ර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත් කරු හා පාරිසරික හා සමාජීය කළමානාකර සැළසම සමග ඇති බැඳීම | | |

**9.7.2** නාය ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම

ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අපදා අවම කිරීමේ පියවරයන් පහත සඳහන් පරිදි වේ.

වගුව **4:** ස්ථානීය **ES & HS** අවම කිරීම සඳහාගනු ලබන පියවර

| **හානි අවම කිරීමේ අයිතමය** | **ව්‍යාපෘතික්‍රි යාත්මක කිරීමේ අදියර** | **වගකීම්** |
|---|---|---|
| **i. ඉදි කිරීම අතරතුර ඛාදනයෙන් සිදුවන බලපෑම අවම කිරීම**<br><br>වැසි කාලය තුළදී ව්‍යාපෘති ස්ථානය බෑවුම් සකස් කිරීම" සුන්බුන් ඉවත් කිරීම ආදී කාර්යයන් සිදු නොකිරීමට නිර්දේශ කර ඇත. එම නිසා වැසි කාලයට පෙර වියළි කාලගුණික තත්ත්වයක දී සිදුකළ හැකි උපරිමය නායයාම අවම කිරීමේ ව්‍යාපෘතිය තුළක්‍රි යාකාරී ලෙස කටයුතු කිරීම අනිවාර්යය වේ. එමෙන්ම වැසි කාලය තුළ ඉහළ බෑවුමේ කිසිදුක්‍රි යාකාරකමක් සිදුනොකිරීමට නිර්දේශකර ඇත. මෙය සැලසුම් අදියරේ දී | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| සලකා බැලිය යුතුය. කපන ලද කොටසෙන් ගලා යන රොන්මඩ සඳහා රොන්මඩ පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. | | |
| **ii. පාසල් පරිශ්‍රයේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**<br><br>කොන්ත්‍රාත්කරු පාසල් පරිශ්‍රයක් තුළ අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කළ යුතු බැවින්, පාසල් පරිශ්‍රය තුළ ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා සැලැස්මක් කල්පනාකාරීව සකස් කළ යුතුය. ස්ථානයේ ආරක්ෂාව සහ ප්‍රශස්තකරණය සැලකිල්ලට ගනිමින් ද්‍රව්‍ය ගබඩා කිරීම ,වාහන නැවැත්වීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම, පිරිසිදු කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රවේශමෙන් තෝරා ගැනීම මෙයට ඇතුළත් විය යුතුය.<br>කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති මෙහෙයුම්වල පරිමාණ කාල සැලැස්ම පිළිබඳ පාසල් කළමනාකාරීත්වය සමඟ සකච්ජා කළ යුතු අතර ඉදිකිරීම් සැලැස්ම පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුවත් කළ යුතුය.<br>වැඩ කරන වේලාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාන කටයුතු සිදු කරන හා පාසලෙහි විශේෂ අවස්ථා ආදියට සිදුවන බාධා අවම කර ගැනීම සඳහා පාසල් කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කර සැලැස්මට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **iii. ඇතුල් වීමටා නොහැකි කලාප**<br><br>ඉදිකිරීම් අදියරේදී ව්‍යාපෘති ස්ථානයේ බෑවුම් අස්ථාවර වීමේ අවදානම පිළිබඳව **PMU** විසින් සවිස්තරාත්මක තක්සේරුවක් ඉදිරිපත් කළ යුතුය අතර ප්‍රවේශ විය නොහැකි කලාප හඳුනා ගැනීම අවශ්‍ය වේ. මෙය ප්‍රමාණවත් ලෙස ලේඛනගත කර කොන්ත්‍රාත්කරුට සහ පාසල් කළමනාකාරිත්වයට දැනුම් දිය යුතුය.<br>එසේම ගමන් කරන වාහන වලින් සිදුවන අනතුරු අවම කිරීම, ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගන්නා ක්‍රියාකාරී යන්ත්‍රෝපකරණ, විදුලි කාන්දුවීම් යනාදිය පිළිබඳව සෞඛ්‍ය හා ආරක්ෂිත කළමනාකරණ සැලැස්මේ යටතේ පවතින ඉහළ අවදානම් සැලකිල්ලට ගනිමින් ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය. ව්‍යාපෘති ස්ථානය තුළ පාසල් පරිශ්‍රයක් ඇති බැවින් අනතුරු ඇඟවීමේ සංඥා සහ ස්ථිර පුහුණුව ලත් මුරකරුවන් සමඟ නිසි ආරක්ෂක පියවරයන් ඇතුළත් කළ යුතුය. බෑවුම් අස්ථායීතා අවදානම දැක්වෙන සංඥා පුවරු මෙම ස්ථානයේ දැඩි ලෙස නිර්දේශ කෙරේ. | ඉදිකිරීම් කාලය තුළ | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |
| **iv. යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය ප්‍රවාහනය**<br><br>ඉදිකිරීම් අදියරේදී ස්ථාන 10ක් සඳහා යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සහ වාහන ප්‍රවාහනය සඳහා ප්‍රවේශ මාර්ග භාවිතා කළ යුතුය. යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය ප්‍රවාහනය පාසලේ පඩිපෙළ හරහා සිදු නොකළ යුතුය. පාසල් පරිශ්‍රය ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ස්ථානයක් ලෙස භාවිතා නොකළ යුතුය.<br>කොන්ත්‍රාත්කරු මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර මාර්ගයේ සිදුවිය හැකි අනතුරු හා පාසල් වත්කම්වලට සිදුවන හානි වළක්වා ගැනීමට දැඩි අවධානයක් යොමු කළ යුතුය.<br>ස්ථානවලට යන්ත්‍රෝපකරණ මාරුවීම් සිදුකිරීමේදී පාසලේ කළමනාකාරිත්වය දැනුවත් කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **v. ආක්‍රමණික විශේෂ**<br><br>බාදනය පාලනය කිරීමේ ව්‍යුහයන් ලෙස ආක්‍රමණික ශාක විශේෂ භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. ශාකමය බාදන පාලනය සඳහා දේශීය ශාක තෝරා ගත යුතුය. වෘක්ෂලතා පාලන පියවර සඳහා භාවිතා කරනු ලබන විශේෂ යොදා ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්රාත්කරු |
| **vi.ශබ්දය සහ කම්පන පාලනය**<br><br>ශබ්දය හා කම්පන උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකම් පාසලේ ක්‍රියාකාරකම්වල සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට බාධාවක් විය හැකිය. ව්‍යුහයන්ට හානි නොවීම සඳහා කම්පන උත්පාදන කටයුතු නියමිත සීමාවන් තුළ සිදු කළ යුතුය. ව්‍යාපෘතිය නිම කිරීමට පෙර හා පසුව ගොඩනැගිලිවල | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| ඉරිතැලීම් නිරීක්ෂණය කළ යුතුය. ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු හේතුවෙන් හානි සිදුවුවහොත් සුදුසු වන්දි ගෙවිය යුතුය. | | |
| **vii. රථවාහන කළමනාකරණය සහ ආරක්ෂාව**<br>රථවාහන කළමනාකරණ පද්ධතිය දිවා රෑක්‍රි යාත්මක විය යුතුය. හදිසි අනතුරු වලට ගොදුරු විය හැකි වංගු සහිත පටු මාර්ගයක් වන බැවින් මාර්ග සංවර්ධන අධිකාරියේ එකඟතාවයෙන් හොඳ රථවාහන කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතුය. එය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙතින් අනුමත කර ගත යුතුය. අනතුරු ඇඟවීම් සංඥා, මාර්ග ආරක්ෂණ සලකුණු පුවරු, නායයෑම් අවදානම් සංඥා පුවරු, පූර්ණ කාලීන දිවා රාත්‍රී මුරකරු, රාත්‍රී ලාම්පු යන ආදිය සැලසුමෙහි අනිවාර්යයෙන් ඇතුළත් විය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **viii. සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව**<br><br>වැඩබිමේදී සේවකයින්ට අවදානම් තත්ත්වයන් යටතේ වැඩ කළ යුතු බැවින්, ESMP හි "සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව" බාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම යටතේ ලබා දී ඇති නිර්දේශක්‍රි යාත්මක කිරීම අත්‍යාවශය වේ. මෙම නිර්දේශයෙන් නිසි සංවිධානයක් සහ ආරක්ෂක නිරීක්ෂණ ක්‍රමයක් තුළ අනුගමනය කළ යුතුය.<br><br>i. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර විශේෂ වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.<br>ii. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර විශේෂ COVID 19 සූදානම් සැලැස්මක් සකස් කරන්න<br>iii. කම්කරුවන්ගේ සහ මගී ආරක්ෂාව සඳහා සුදුසු අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකරුවෙකු මෙම වැඩබිමේ සේවයේ යෙදවීම සඳහා දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ.<br>iv. කම්කරුවන් සහ මගීන් මතට පාෂාණ කොටස් කඩා වැටීමේ අවදානමෙන් ආරක්ෂා කිරීම සඳහා සම්මත සේවක ආරක්ෂණ ක්‍රම අනුගමනය කරමින් අවදානම් ස්ථානවල ආරක්ෂිත බාධක සහ ආරක්ෂිත දැල් සවි කළ යුතුය.<br>v. ආරක්ෂිත සපත්තු, හිස්වැසුම්, ආරක්ෂිත ඇඳුම් ඇස් කණ්ණාඩි වැනි පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) සැපයීම.<br>vi. සේවකයින්ට පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දීම<br>vii. ප්‍රධාන ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට පෙර උපද්‍රව විශ්ලේෂණය සිදු කිරීම සහ හඳුනාගත් එවැනි උපද්‍රව සඳහා ප්‍රමාණවත් අවම කිරීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම/සැපයීම.<br>viii. බඹර කූඩුව ආදිය එම ආසන්නයේ පිහිට තිබේ නම්, සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඉවත් කිරීමේ මධ්‍යස්ථාන භාවිතා කිරීම අනිවාර්ය වේ.<br>ix. මීට අමතරව, අස්ථායී ඉඩම්වල අවම කිරීමේ කටයුතු සිදු කිරීම වැසි සමයේදී ඉතා අවදානම් සහිත බැවින් වර්ෂා කාලය තුළ ප්‍රමාණවත් කාලයක් සඳහා අවම කිරීමේ කටයුතු නතර කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **ix. පාසල් දරුවන්ගේ ආරක්ෂාව**<br><br>පහත සඳහන් පරිදි පාසල් දරුවන්ට ඇති විය හැකි ගැටලු පිළිබඳව පාසල් කළමනාකරණය ප්‍රමාණවත් ලෙස දැනුවත් කළ යුතුය<br><br>i.මත්ද්‍රව්‍ය, මත්පැන්, ලිංගික අපයෝජන, ජාවාරම්, විවිධ අපරාධ වැරදිසහ නුසුදුසු හැසිරීම් රටා පිළිබඳව පාසැල් ළමුන් දැනුවත් කිරීම.<br>ii.පාසල් භූමිය තුළට අනවසර පිවිසුම<br>iii. දරුවන්ට උසුළු විසුළු කිරීම හා හිරිහැර කිරීම<br>iv. දරුවන් හා දෙමාපියන් සමග රණ්ඩුවීම<br>v.සිතේ එකග බවකින් තොරව දරුවන් අධ්‍යාපනයේ යෙදීම<br>vi. දූෂිත ගනුදෙනු සඳහා දරුවන් හා දෙමව්පියන් පෙළඹවීම<br>vii. අවිධිමත් ලෙස ළමා ශ්‍රමය ලබා ගැනීම<br><br>PMU හි ES ඒකකය මගින් ඉහත සඳහන් ගැටළු සම්බන්ධයෙන් පාසැල් කළමනාකරණ පූර්ණ දැනුමක් ලබා ගත යුතුය. සෑම ගැටළුවක්ම නිසි ලෙස සන්නිවේදනය කිරීම හා පාසල් කළමනාකරණය සමග ප්‍රමාණවත් ලෙස සාකච්ඡා කළ යුතුය. එමෙන්ම PMU ආයතනය මගින් පාසල් කළමනාකරණයෙන් පහත දැක්වෙන ඉල්ලීම් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.<br><br>i. සිසුන් සහ දෙමාපියන් ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීම<br>ii. දරුවන්ට බලපෑම් ඇති කළ හැකි සමාජ ගැටළු<br>iii. ශ්‍රම බලකාය සමග දරුවන්ගේ හැසිරීම හා ශ්‍රම බලකාය සමගක්‍රි යා කිරීම් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.<br>iv. ව්‍යාපෘතියට අදාලව ඕනෑම පැමිණිල්ලක් ලබාගැනීම සඳහා පාසල් ප්‍රදේශයේ රහසිගත තොරතුරු ලබා ගැනීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම<br>v. පාලනයක් කම්කරුවන්ට දඬුවම් කිරීම හෝ ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම<br><br>ව්‍යාපෘතියේ ශ්‍රම බලකාය පාසලේ දරුවන් සමග සම්බන්ධතා පැවැත්විය යුතු ආකාරය පිළිබඳව කොන්ත්රාත්කරු දැනුවත් කළ යුතු අතර කොන්ත්රාත්කරුවන්ගේ ශ්‍රම බලකාය සඳහා පහත දැක්වෙන කරුණු ඉදිරි පත් කර ඇත.<br>i. නිසි දැනුවත්භාවය, අධ්‍යාපනය, අධීක්ෂණය හා දඬුවම් කිරීම.<br>ii. පාසැල් පරිශ්‍රයට සේවකයින්ට ඇතුල් නොවිය හැකි පරිදි ව්‍යාපෘති කලාපය නිර්ණය කිරීම<br>iii. සේවකයන් හට පාසැලේ ජල මූලාශ්‍ර භාවිතා කිරීමට නොහැක<br>iv. සේවකයනට පාසැලේ සනීපාරක්ෂක පහසුකම් භාවිතා කිරීමට නොහැක<br>v. කොන්ත්රාත්කරු විසින් කිසියම් ආකාරයක ව්‍යාපෘතිය සම්බන්ධ කටයුතු (ඍජු / වක්‍ර) සඳහා ළමුන් සහභාගී කර ගත නොහැක<br>vi. යන්ත්‍රෝපකරණක්‍රි යාත්මක කිරීමේ දී බර යන්ත්‍රෝපකරණක්‍රි යාකරුවන් අතිශය ප්‍රවේසම් විය යුතු අතර එමගින් අනතුරු සිදුවිය හැකි වනු ඇත.<br>vii. අවදානම් කලාපවල බර යන්ත්‍රෝපකරණ සහ වාහනවල ගමනාගමනය පිළිබඳ ආරක්ෂාව තහවුරු කිරීම කිරීම සඳහා පූර්ණ කාලීන මුරකරුවෝ සිටිය යුතුය<br><br>වෙනත්<br>i. ව්‍යාපෘති ප්‍රදේශයට පාසල් සිසුන්ට ඇතුළු වීම තහනම් බව ඇගවීමට ඇතුළු වීම තහනම් / අන්තරාය සංඥා හා ස්ථාපිත කිරීම හා අධීක්ෂණය කිරීම<br>ii.ළමුන්ට විදුලි සැර වැදීම් වැනි අනතුරු වලින් ආරක්ෂා කර ගැනීම සඳහා PMU විසින් අනුමත කරන ලද නිසි ආරක්ෂණ පියවර මගින් විද්‍යුත් රැහැන් පද්ධති සකස් කළ යුතුය.<br>iii. PMU විසින් අනුමත ස්ථාන වල වාහන නැවැත්වීම හා ගබඩා කිරීම | ඉදිකිරීම් කාලය තුළ | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **x. පිපිරීම්/පිපිරවීම් හේතුවෙන් පාෂාණ කොටස් නිසා ඇතිවන තුවාල**<br><br>පාසල් වේලාව තුළ පිපිරවීම් කටයුතු අවම කිරීම සහ පිපිරුම් කාලසීමාව පිළිබඳව දැනුවත් කිරීම් සිදු කළ යුතු අතර පිපිරීම්/පිපිරවීම් හේතුවෙන් පාෂාණ කොටස් විසිවීම නිසා ඇතිවන හදිසි අනතුරු සඳහා සූදානම් වීමේ සැලැස්මක් ස්ථාපිත කිරීම. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xi. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br><br>ඉදිකිරීම් කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විශේෂ අවධානය යොමු කළ යුතුය. මෙම ව්‍යාපෘති ස්ථානය ප්‍රසන්න හා පිරිසිදු පාසල් පරිශ්‍රයක් තුළ තුළ පිහිටා ඇති බැවින්<br>එවැනි අපද්‍රව්‍ය ජනනය වූ විට PMU විසින් අනුමත ක්‍රමවේදයන් අනුව සේදී යාම් වලට ලක් නොවන පරිදි ගබඩා කර ඉවත් කල යුතුය. ඉදිකිරීම් අතරතුර උත්පාදනය වන කසල පාසල් භූමියේ හෝ මාර්ගය දෙපසට දැමීම වැනි දෑ නොකල යුතුය | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xii. කොන්ත්‍රාත්කරුගේ සේවකයන්ගේ සනීපාරක්ෂක පහසුකම් සපයා ගැනීම**<br><br>කම්කරුවන් විවෘත භූමිය තුළ මලපහ කිරීම අවම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් අවම කිරීමේ ස්ථානය තුළ ශ්‍රම බලකාය සඳහා තාවකාලික සනීපාරක්ෂක පහසුකම් සලසා දිය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xiii. ඉදිකිරීම් සඳහා ජලය භාවිතය**<br><br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත අවම කිරීමේ ප්‍රදේශය තුළිනි. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xiv. වැඩ කරන වේලාවන්**<br><br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයට පමණක් සීමා කළ යුතු අතර ආරක්ෂිත ගැටළු හේතුවෙන් සවස 6 න් පසු අවම කිරීමේ කටයුතු කිරීම නිර්දේශ නොකරනු ලැබේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xv. යටිතල පහසුකම් මත බලපෑම**<br><br>PMU හි අනුමැතියට අනුව ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර දුරකථන, විදුලිය, ජල මාර්ග හා වෙනත් අත්‍යවශ්‍ය පහසුකම් ස්ථානගත කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xvi. සාමාන්‍ය ජනතාවට ව්‍යාපෘති භූමියට ඇතුළු වීමේ හැකියාව**<br><br>කොන්ත්‍රාත්කරු විසින් පූර්ණ කාලීනව සේවයේ යෙදවිය යුතු මුරකරුවන් විසින් දැනුවත් කිරීම, අනතුරු ඇඟවීමේ සංඥා සහ සුපරීක්ෂාකාරී වීමෙන් ව්‍යාපෘති භූමියට අනවසරයෙන් ප්‍රවේශ වීම වළක්වා ගත යුතුය | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xvii. දෘෂ්‍ය දූෂණය අවම කිරීම**<br><br>වැඩ බිමෙහි කටයුතු දෘෂ්‍ය දූෂණය අවම වන පරිදි පවත්වා ගත යුතු ය | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ<br>ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xviii. සේවකයන් සඳහා වන ආචාරධර්ම**<br><br>කොන්ත්‍රාත්කරු විසින් එකඟ වූ හැසිරීම් රටාවන් පිළිපදිමින් පාසල් ප්‍රජාව/දෙමාපියන් හා ශ්‍රම බලකාය අතර විය හැකි ගැටුම් වලක්වා ගත යුතුය | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xix.** හදිසි අනතුරු කළමනාකරණය<br>මෙවැනි ස්ථාන වල අනතුරු බහුලව සිදු වන බැවින් අනතුරු සඳහා නිසි හදිසි කළමනාකරණ ඒකකයක් (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත ද්‍රව්‍ය, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) පවත්වාගෙන යා යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

### 9.7.3 ව්‍යාපෘති ස්ථානයට අදාල විශේෂිත අධීක්ෂණ තත්ත්වයන්

ඉදිකිරීම් අදියර තුළ පහත සඳහන් අධීක්ෂණ සැලැස්ම නිර්දේශ කර ඇත. මීට අමතරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ සඳහන් කළ යුතු නිරීක්ෂණ ක්‍රියා පටිපාටිය ද ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරණ ලද ඉල්ලුම්පත තුළ ඔහුගේ නිපුණතා පිළිබඳ අදාළ ලේඛන සමඟ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ESMP වැඩපිළිවෙළ යොමු කරණු ඇත. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්විය යුතුය. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික සහ සමාජ කළමනාකරණ ක්‍රම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එය PMU ඒකකය මගින් අනුමත කිරීමට නියමිතය

වගුව **5:** පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම**;** ඉදිකිරීම් අදියර

| අධීක්ෂණ අවශතාවය | පරාමිතීන් | වාර ගණන |
|---|---|---|
| i. මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය | - |
| | පාසල් ගොඩනැගිලි වල පූර්ව ඉරිතැලීම් නිරීක්ෂණය | වරක් * |
| | භූමියේ සිදුවන කම්පන | වරක් * |
| | වායු ගුණාත්මකභාවය: වායු අංශු | වරක් * |
| | පසුබිම් ශබ්දය මැනීම | වරක් * |
| ii. ඉදිකිරීම් අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | - |
| | පූර්ව ඉරිතැලීම් නිරීක්ෂණය | ඉදිකිරීම් අතරතුර සැලකිය යුතු විස්ථාපනයක් නිරීක්ෂණය කළහොත් ** |
| | භූමියේ සිදුවන කම්පන | විදුම් යන්ත්‍රෝපකරණ, විදුම් වැඩ, හෝ භූ කම්පන ජනනය කරන ඕනෑම කාර්යයක් ක්‍රියාත්මක කිරීමේදී * |
| | ඉදිකිරීම් වල දී ඇති වන ශබ්දය | අධික ශබ්ද උත්පාදනය කරන කාලවලදී මසකට වරක් * |
| | වායු ගුණාත්මකභාවය: වායු අංශු | මසකට වරක් * |
| iii. රථවාහන විමෝචනය | ව්‍යාපෘති කටුයුතු සඳහා යොදා ගන්නා සියළුම යන්ත්‍රෝපකරණ වල වායු විමෝචන පිළිබඳ සහතික තිබීම අත්‍යාවශ්‍ය වේ. ව්‍යාපෘති භූමියේ කාර්යභාර පරිසර නිලධාරී වරයා විසින් ඒවා පරික්ෂාවට ලක් කල යුතුය. | |
| iv. අධීක්ෂණ ආයතනය | *මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි සහතික සහිත ස්වාධීන අධීක්ෂණ ආයතනයක් මගින් ඉරිතැලීම් පරීක්ෂණ හැර අනෙකුත් පරීක්ෂණ සඳහා යොදාගත යුතුය.<br>**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය :PMU විසින් පිළිගනු ලබන විශ්වාසී ආයතනයක් මගින් ඉරිතැලීම් පරීක්ෂණ කල යුතුය | |
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | *ජල මාර්ග වල ජලයේගුණාත්මකභාවය* – 2019 අංක 01 දරණ ජාතික පාරිසරික (පරිසර ජල තත්ව ) රෙගුලාසි සමඟ සැසඳීම<br>**අධි අවදානම් ගොඩනැගිලි පිළිබඳ පූර්ව ඉදිකිරීම් ඉරිතැලීම් සමීක්ෂණය - වෘත්තීමය වාර්තාව**<br>*පොළවේ කම්පනයන් - යන්ත්‍ර සූත්‍රවලින් ඇති වන පොළවේ කම්පනයන්. ඉදිකිරීම් අතරතුර හා වාහන වලින් ඇතිවන කම්පනයන්*, *මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව*<br>*වට පිටාවෙන් ඇති වන ශබ්දය මැනීම - මධ්‍යම පරිසර අධිකාරියේ අංක* **924.1 1996** *මැයි* **01** *දින විශේෂ ගැසට් පත්‍රය*<br>*වායු ගුනාත්මකභාවය සම්බන්ධ කරුණු - ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ අංක* **1562/22 2008** *අගෝස්තු* **15 -** *විශේෂ විචේදනයේ සඳහන් අවම වායුගුණ තත්ත්වයන්.* | |

## 10.සේවක කළමනාකරණය

නිසි සේවක-කළමනාකරණ සම්බන්ධතා, ව්‍යාපෘතියේ සේවකයින්ට සාධාරණ ලෙස සැලකීම සහ ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා තත්වයන් සැපයීම අවශ්‍ය වේ. මෙහි වගකීම පැවරෙන්නේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වෙතය.
මෙහි අරමුණු නම්;

- රැකියාවේ ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය .
- ව්‍යාපෘති සේවකයින්ට සාධාරණ ලෙස සැලකීම, වෙනස් ලෙස නොසැලකීම සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- කාන්තාවන්, ආබාධිත පුද්ගලයින්, ළමුන් සහ සංක්‍රමණික සේවකයින්, කොන්ත්‍රාත් කම්කරුවන්, ප්‍රජා සේවකයින් සහ ප්‍රාථමික සැපයුම් කම්කරුවන් වැනි අවදානමට ලක්විය හැකි කම්කරුවන් ඇතුළු ව්‍යාපෘති සේවකයින් ආරක්ෂා කිරීම.
- සියලු ආකාරයේ බලහත්කාර ශ්‍රමය සහ ළමා ශ්‍රමය භාවිතා කිරීම වැළැක්වීම.
- ජාතික නීතිවලට අනුකූල වන පරිදි ව්‍යාපෘති සේවකයින්ගේ ආශ්‍රිත නිදහස සහ සාමූහිකව කේවල් කිරීම යන මූලධර්මවලට සහාය වීම.
- සේවා ස්ථාන ගැන සැලකිලිමත්භාවය ඉහළ දැමීම සඳහා ව්‍යාපෘති සේවකයින්ට ප්‍රවේශ මාර්ග සැපයීම.

## 11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් -19 වැළැක්වීමේ පියවර

කොවිඩ් -19, නව කොරෝනා වයිරස් ආසාදනය ලෝකයෙන් මුළුමනින්ම තුරන් කර නැත. එබැවින්, සැක සහිත තත්වයක් අනාවරණය වුවහොත් ඇතිවන භීතික අවස්ථා වළක්වා ගැනීම සඳහා මෙන්ම ආසාදන පැතිරීම වැළැක්වීම / පාලනය කිරීම සඳහා, සියලුම කොන්ත්‍රාත්කරුවන්ට කොවිඩ්-19 සූදානම් කිරීමේ සැලැස්මක් සකස් කළ යුතු අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් 2020 අපියෙල් 29 දින සපයන ලද "කොවිඩ්-19 පැතිරී යාමකදී ශ්‍රී ලංකා ඉදිකිරීම් ස්ථාන සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශයන් " අනුව එය කියාත්මක කළ යුතු වේ.

## 12.පදිංචි ජනතාව සහ පාර්ශවකරුවන්ගේ උපදේශන - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්

### 12.1 මහජන උපදේශන

නායයාමේ පූර්ව අනතුරු ඇඟවීම්, අවම කිරීමේ ව්‍යාපෘතිය සහ අරමුදල් සැපයීමේ යාන්ත්‍රණය පිළිබඳව විද්‍යාලයේ විදුහල්පති DMNC . කුමාර මහතා සහ භූගෝල විද්‍යා ගුරු ශාන්ත බැරගමආරච්චි යන මහත්වරුන් දැනුවත් කරන ලදී. මෙම නාය යෑම් අවම කිරීමේ කටයුතු අගය කළ හැකි බවත් කාර්ය මණ්ඩලයේ පූර්ණ සහයෝගය ඇතිව ව්‍යාපෘතිය සඳහා තම කැමැත්ත පළ කළ බවත් ඔවුන් ප්‍රකාශ කර සිටියේය.

### 12.2 පාර්ශවකරුවන් සමග පවති උපදේශන සේවාවන් වලදී ඇති වූ එකගතාවයන් හා නිර්දේශයන් (යොමුව: ඇමුණුම II)

මෙම ව්‍යාපෘතිය පිළිබඳව මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ වන අයි.ඒ.කේ. රණවීර මහතා සමඟ සාකච්ඡා කළ අතර නාය යාම අවම කිරීමේ කටයුතු අත්‍යාවශ්‍ය බවත් ඒ සඳහා ඔවුන්ගේ සහයෝගය ලබාදීමටද එකඟ වන බවත් ඔහු ප්‍රකාශ කර සිටියේය.
ඉන්පසුව ව්‍යාපෘති කටයුතු පිළිබඳව මධ්‍යම පළාතේ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් අධ්‍යක්ෂ M.K.P වැලිකන්නගේ මහතා දැනුවත් කර ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අවසර ලබා ගත්තේය. තවද ගැසට් මගින් නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති නියමිත ව්‍යාපෘතියක් ලෙස නොසලකන බව ඔහු ප්‍රකාශ කර සිටියේය.
ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය පිළිබඳ සලකා බැලීමෙන් , මෙමගින් හදිසි අවස්ථාවක් සඳහා නායයෑම් අවදානම අවම කිරීමට අදහස් කරන බැවින් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය නොවේ.

13.ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යෝග්‍යතා, කැමැත්ත ප්‍රකාශනය, එකඟතාව සහ අනුමත කිරීම්

වගුව 7: බාධා ඉවත් කර ගැනීම්, විරෝධතා නොමැති බව, කැමැත්ත සහ අනුමත කිරීම්

| අවශ්‍යතාවය / අනුමත කිරීම / ආයතනය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|
| **13.1** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | |
| දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට සිදුවනු ඇති අතර මෙහිදී මහ ඇමති වරයා සහ දිස්ත්‍රික්කයේ වගකිව යුතු ආයතන සහභාගී වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හමුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ යුතු වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරියෙකු ව්‍යාපෘතිය පිළිබඳ විස්තර කරමින් එහි විවිධ පාරිසරික සහ සාමාජයීය ගැටළු ආදිය ගැන කරුණු ඉදිරිපත් කරණු ඇත. මෙම ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් මෙම රැස්වීමේදී ගනු ලබන නිර්දේශ මෙම පාරිසරක සහ සමාජයීය කළමනාකරණ සැලසුම ක්‍රියාවට නංවන විට සැලකිල්ලට ගැනෙනු ඇත. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | මෙම ව්‍යාපෘතිය මහනුවර නගර සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබාගත යුතුය |
| **13.2** ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය | |
| මධ්‍යම පරිසර අධිකාරිය | 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනත යටතේ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සංවේදී ප්‍රදේශය යටතේ පවතින බැවින් දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වේ. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන රක්ෂිත වෙන්කිරීම් කලාපයක යටතේ හෝ තුළ මෙම ව්‍යාපෘති වැඩබිම පිහිටා නොමැති බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාරයාංශය | භූමි, පාෂාණ හා ඛනිජමය සුන්බුන් ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාරයාංශයේ අනුමැතිය ලබාගත යුතුය (අවශ්‍යනම් පමණි) |
| මහනුවර නගර සභාව | අපද්‍රව්‍ය ප්‍රවාහනය සහ බැහැර කිරීම වැනි කටුයුතු සඳහා හැටන් නගර සභාවෙන් අනුමැතිය ලබාගත යුතුය.. |
| ලංකා විදුලිබල මණ්ඩලය | ව්‍යාපෘති භූමියේ විදුලිබල සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය අවශ්‍ය වේ. |
| ජාතික ශාක නිරෝධායන සේවය | මෙම අපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා පැලැටි හෝ බීජ අවශ්‍ය වේ නම් (ආනයනය කල යුතු නම්) 1999 අංක 35 දරණ පැලැටි සංරක්ෂණ පනත යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්, අතිරේක අධ්‍යෂක ජාතික ශාක නිරෝධායන සේවය, කටුනායක. අනුමත කල පැලැටි හෝ බීජ අධිකාරිය මගින් නිකුත් කරණ බලපත්‍රය හා කොන්දේසි යටතේ ගෙන ආ යුතුය |
| **13.3** පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබාගැනීම/නෛතික බැදීම/ විරුද්ධත්වයක් නොමැති වීම | |
| ඉඩම් හිමිකරුවන් (අධ්‍යාපන අමාත්‍යාංශය) | ඉඩම් හිමිකරු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කිරීම, ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට එකගතාවය ලබා ගත යුතුය. |

අනුමැතීන් ලබා ගැනීම යොජිත කාල රාමුව වගු අංක 8න් දක්වා ඇත.

වගුව **8:** අනුමැතීන් ලබාගැනීම සඳහා නියමිත කාල රාමුව

| අනුමැතීන් | මාසය 1 | | | | මාසය 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය1 | සතිය2 | සතිය3 | සතිය4 | සතිය5 | සතිය6 | සතිය7 | සතිය8 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ<br>අනුමැතිය<br>අයදුම් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම** | | | | | | | | |
| ***සැළසුම් කමිටුවේ අනුමැතිය<br>අයදුම් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම*** | | | | | | | | |
| **රජයේ ඉඩම් හිමියන්ගේ<br>ආයුර්වේද දෙපාර්තමේන්තුවේ<br>අනුමැතිය**<br>*අයදුම්පත බාරදීම<br>දක්වන අදහස් වලට ප්‍රතිචාර<br>දැක්වීම<br>අනුමැතීන්* | | | | | | | | |
| **වෙනත් අනුමැතීන්<br>භූ විද්‍යා සමීක්ෂණ හා පතල්<br>කාර්යාංශයේ<br>ආරක්ෂක අමාත්‍යාංශයේ<br>අනුමැතිය (අවශ්‍යතාවය අනුව)** | | | | | | | | |
| ඉඩම් හිමිකරුවන්ගේ<br>අනුමැතිය/කැමැත්ත<br>ලබාගැනීම ( අධ්‍යාපන<br>දෙපාර්තමේන්තුව) | | | | | | | | |

## 14. දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රනය

මෙම ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූ ප්‍රජාව සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා උපදේශකවරුන් වන **PMU** හි **ES** නිලධාරි වරයා වගබලා ගත යුතුය. (යොමුකිරීම: දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා නිර්දේශිත ක්‍රියා පටිපාටිය සඳහා පරිසර හා සමාජ කළමනාකරණ රාමුව)

## 15.තොරතුරු අනාවරණය කිරීම

පහත දැක්වෙන ආයතන සහ සංවිධාන අනුව ලකුණු කරණ ලද ආකෘති මගින් **ES** තොරතුරු අනාවරණය කිරීම **PMU** හි වගකීම වේ.

වගුව **9:** තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු සන්නිවේදන ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘතිය සැලසුම් කිරීම (ඉදිකිරීම් ප්‍රදේශයේ තොරතුරු, සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය) | දිස්ත්‍රික් CEA, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන, ජා.ගො.ප.ස දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව.ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ වාර්තා සැපයීම, අනුමැතීන් හා එකඟතා |
| පාරසරික හා සාමාජීය කළමනාකරණ සැලසුම | දිස්ත්‍රික් CEA, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව.ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ වාර්තා සැපයීම, අනුමැතීන් හා එකඟතා |
| ප්‍රගති වාර්තා (මූලික අදියරේදී හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් CEA, AIIB හා වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන | ප්‍රගති සමාලෝචන රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාල වාර්තා භාර දීම. |
| කම්කරුවන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය පාරිසරික යෝග්‍ය බව අදාල ඉදිකිරීම් භූමියේ සුපරීක්ෂණය | දිස්ත්‍රික් CEA, ප්‍රාදේශීය ලේකම්ල පොලීසිය, ග්‍රාම නිලධාරී, ජා.ගො.ප.ස දිස්ත්‍රික් කාර්යාලයල AIIB වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන | වාචික හා අවිවාචික (ලිඛිත) සන්නිවේදනය, ආදාල වාර්තා භාරදීම |
| v. ES කාරණාවලට අදාළව ගත් තීරණ සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, පොලිසිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාලය , AIIB සහ අදාළ පාර්ශවයන් සුදුසු පරිදි | රැස්වීම්, අදාල වාර්තා භාර දීම. |
| vi. දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශව, AIIB | රැස්වීම්, වාචික හා අවිවාචික (ලිඛිත) සන්නිවේදනය |

වගුව **10:** තොරතුරු රැස්කිරීම සඳහා සම්බන්ධකරගත් ආයතන සහ නිලධාරීන්

| දිනය | ආයතනය | තොරතුරු සඳහා සම්බන්ධ වන නිලධාරියා |
|---|---|---|
| 28/02/2019@ 09.30 | මධ්‍යම පරිසර අධිකාරිය | M.K.P වැලිකන්නගේ මහතා,<br>පළාත් අධ්‍යක්ෂ,<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>මධ්‍යම පළාත. |
| 30/05/2019 @ 09.30 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර දිස්ත්‍රික්කය | I.A.K.රණවීර මහතා<br>සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්),<br>දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය,<br>මහනුවර දිස්ත්‍රික්කය |
| 03/09/2023@ 13.00 | මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලය | D.M.N.C කුමාර මහතා<br>විදුහල්පති<br>කිංග්ස්වුඩ් විද්‍යාලය - මහනුවර |
| 03/09/2023@ 13.00 | මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලය | ශාන්ත බැරගමආරච්චි මහතා<br>භූගෝලීය ගුරුවර<br>කිංග්ස්වුඩ් විද්‍යාලය - මහනුවර |

ඇමුණුම **1:** ව්‍යාපෘති ප්‍රදේශයේ සහ අදහස් විමසීම් සිදුකරණ අතරතුර ලබාගත් ජායාරූප

| | |
|---|---|
|  |  |
| මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම පළාතේ පළාත් අධ්‍යක්ෂක වන *M.K.P* වැලිකන්න මහතා සමග *සාකච්ඡා කිරීම*<br>. | මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ *I.A.K* රණවීර මහතා සමග *සාකච්ඡා කිරීම* |
|  | |
| *කිංග්ස්වුඩ් විද්‍යාලයේ භූගෝල විද්‍යා ගුරු ශාන්ත බැරගමආරච්චි මහතාගෙන් තොරතුරු ලබා ගැනීම* | |

ඇමුණුම **II: පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු : මහනුවර දිස්ත්‍රික්කය**

| ආයතනය | සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර | ඉදිරිපත් වූ සැලකිය යුතු කරුණු |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය | M.K.P වැලිකන්නගේ මහතා,<br>පළාත් අධ්‍යක්ෂ,<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>මධ්‍යම පළාත. | ✓ ජාතික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ 1951 යටතේ අංක 25 සහ 1953 යටතේ අංක 29 දරණ පාංශු සංරක්ෂණ පනත යටතේ මහනුවර දිස්ත්‍රික්කය සංවේදී ප්‍රදේශයක් ලෙස ගැසට් කර ඇත.<br>✓ මෙම ගැසට් පත්‍රය යටතේ ව්‍යාපෘතියේ වැදගත්කම නොසලකා මෙම ප්‍රදේශය තුළ කිසිදු සංවර්ධනයකට ඉඩ නොදේ.<br>✓ නමුත් ආපදා අවස්ථාවකදී මෙය සලකා නොලැබේ .<br>✓ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති ගැසට් පත්‍රයේ දක්වා ඇති ව්‍යාපෘතියක් ලෙස නොසැලකේ.<br>✓ හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස නායයෑම් වලින් ඇති වන අවදානම අවම කිරීමට ව්‍යාපෘතිය අදහස් කරන බැවින්, ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවේ.<br>✓ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අවම කිරීමේ නාය යාම අවම කිරීමට අවශ්‍ය බව සඳහන් කර ඉල්ලීමක් කළ යුතුය.<br>✓ අවම කිරීමේ කටයුතු නියමිත ව්‍යාපෘතියක් තුළ නොමැතිව සංවේදී ප්‍රදේශයක ක්‍රියාත්මක කරන්නේ නම් අවම කිරීමේ කටයුතු පාලනය කරනු ලැබේ. |
| මහනුවර මහ නගර සභාව | P.B. අබේකෝන් මහතා<br>ප්‍රධාන ඉංජිනේරු,<br>මහනුවර මහ නගර සභාව<br>මහනුවර | ✓ මෙම ප්‍රදේශය මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයට අයත් වේ.<br>✓ ඉදිකිරීම් අපද්‍රව්‍ය / කැණීම් ද්‍රව්‍ය මහජනතාවට / මගීන්ට හිරිහැරයක් නොවිය යුතු බව ද සඳහන් වේ. |

ඇමුණුම **III:** රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රියා පටිපාටිය.

**1. දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික නිෂ්කාශනය සඳහා යෝජිත අනුමත ක්‍රියා පටිපාටිය**

i. **ව්‍යාපෘති සකස් කිරීමේ අදියරේදී,** PMU **හි** ES **සහ** H&S **ඒකකය ව්‍යාපෘති ස්ථානයටම විශේෂිත වූ** ESMP **අධ්‍යයනය කරන අතර, ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක් වන වපසරිය ඇතුළත් සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.**

ii. **මූලික තොරතුරු ප්‍රශ්න කරන්නෙකු (**BIQ**) විසින් සම්පූර්ණ කර ඉහත විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය.**

iii. PMU **මගින් අදාළ** ESMP **පිළිබඳ ව්‍යාපෘති විස්තර සහ අවශ්‍ය වැඩිදුර තොරතුරු මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දිය යුතුය.**

iv. **ව්‍යාපෘතිය විසින් පිළිපැදිය යුතු අවම කිරීමේ ස්ථානය පිළිබඳ විශේෂිත කොන්දේසි වලට යටත්ව අනුමැතිය ලබා දෙනු ලැබේ.**

*ඇමුණුම* **IV:** අධ්‍යන කණ්ඩායම

| නම | තනතුර | කාර්යභාරය |
|---|---|---|
| SAMS දිසානායක | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ /ESSD/NBRO | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ |
| VDW සුමනසේකර | විද්‍යාඥ / ESSD/NBRO | ක්ෂේත්‍ර සමීක්ෂණය, වාර්තා සම්පාදනය |
| ප්‍රභාත් ලියනආරච්චි | විද්‍යාඥ / ESSD/NBRO | පරිසර විද්‍යාඥ |
| H කුසලසිරි | තාක්ෂණ නිලධාරි /ESSD/NBRO | GIS / ප්‍රජාවිද්‍යාත්මක දත්ත/සමීක්ෂණ සහයක |

*ඇමුණුම* **V:** ***යොමු ලැයිස්තුව***

1. සාමාන්‍ය පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම සඳහා ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුගේ බැදීම්-AIIB
2. පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව - ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - AIIB